සේවක අර්ථසාධක අරමුදල
ஊழியர் சேமலாப நிதியம்
Employees' Provident Fund

# 2023

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

ප්‍රකාශනය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01

මුද්‍රණය: සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම

# අන්තර්ගතය
# உள்ளே
# CONTENTS

1 - 112
සිංහල

113 - 240
தமிழ்

241 - 356
English

357 - 368
සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය
புள்ளிவிபரவியல் பின்னிணைப்பு
Statistical Appendix

# සේවක අර්ථසාධක අරමුදල
# වාර්ෂික වාර්තාව
# 2023

ශ්‍රී ලංකාවේ පුද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින්ගේ විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල වන රුපියල් ට්‍රිලියන 3.8 ඉක්මවූ වත්කමක් පාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල විසින්, එහි වත්කම් පදනමෙහි අඛණ්ඩ වර්ධනය 2023 වසරේ දී ද තවදුරටත් පවත්වා ගන්නා ලදී. එසේම, අරමුදල විසින් සිය සාමාජිකයන් වෙත සපයන සේවාවන් හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ සාමාජිකයන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලබා දීමට මෙන්ම අරමුදලේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීමට සමත් විය. ඒ අනුව, අරමුදලේ ශුද්ධ වත්කම් වටිනාකම 2022 වසර අග වාර්තා වූ රුපියල් බිලියන 3,459.9 ට සාපේක්ෂව 2023 වසර අගදී රුපියල් බිලියන 3,857.4 ක් දක්වා සියයට 11.5 කින් වර්ධනය විය. වර්ෂය තුළ දී, සේවක අර්ථසාධක අරමුදල එහි සුරක්ෂිතභාවය සහ වර්ධනය පවත්වා ගනිමින් එහි සාමාජිකයන්ට ඵලදායී සේවාවන් රැසක් සමඟ ඉහළ විශ්‍රාම ප්‍රතිලාභ සපයන ලදී. සේවක අර්ථසාධක අරමුදල විසින් සිය අරමුදල් කළමනාකරණ කාර්යයන් සාර්ථක ලෙස මෙහෙයවමින් රුපියල් බිලියන 469 ක ආදායමක් උපයා ගැනීමට 2023 වසරේ දී සමත් විය. ඒ අනුව, අරමුදලේ මුළු ආයෝජන වටිනාකම රුපියල් බිලියන 3,867.6 ක් දක්වා ළඟා විය. එසේම, වෙළෙඳපොළ පොලී අනුපාතවල පැවති ඉහළ උච්චාවචනයන් යටතේ වුව ද සේවක අර්ථසාධක අරමුදලට සිය සාමාජිකයන් හට 2023 වසරේ දී සියයට 13.00 ක ආකර්ෂණීය ප්‍රතිලාභ අනුපාතයක් ලබා දීමට හැකියාව ලැබුණි.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5 (1) (ස) වගන්තිය ප්‍රකාරව, 2023.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පිටපත් 2024.03.28 දින කම්කරු හා මුදල් අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී. තවද, එම මූල්‍ය ප්‍රකාශන 2024.04.03 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.

# පටුන

කොටස අ

## ආයතනික භාරකාරත්වය


| | |
|---|---|
| අධිපති සහ පාලක මණ්ඩලයේ සභාපතිතුමන්ගේ පණිවිඩය | 1 |
| කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය | 3 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 5 |
| නියාමන රාමුව | 7 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය | 8 |
| කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාරය | 9 |


කොටස ආ

## ආයතනික විශ්ලේෂණය


| | |
|---|---|
| දැක්ම හා මෙහෙවර | 12 |
| ගමන්මගෙහි මංසළකුණු | 14 |
| මූල්‍ය තොරතුරු 2023 | 17 |
| මෙහෙයුම් තොරතුරු 2023 | 21 |
| සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගති සමාලෝචනය 2023 | 23 |


කොටස ඇ

## මූල්‍ය ප්‍රකාශන


| | |
|---|---|
| ආදායම් හා වියදම් ප්‍රකාශනය | 37 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 38 |
| ලැබීම් හා ගෙවීම් ගිණුම | 39 |
| ආයෝජන ප්‍රකාශනය | 40 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 41 |
| හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයින්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය | 42 |
| මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් | 43 |


කොටස ඈ


| | |
|---|---|
| **විගණකාධිපති වාර්තාව** | 101 |


කොටස ඉ

## සංඛ්‍යා සටහන් හා අතිරේක තොරතුරු


| | |
|---|---|
| 1. ආයෝජන, කල්පිරීම් හා ආයෝජන මත ප්‍රතිලාභ (1994-2023) | 359 |
| 2. සාමාජික ශේෂ මත ප්‍රතිලාභ අනුපාතිකය (1994-2023) | 360 |
| 3. සාමාජික ශේෂ, සාමාජික ශේෂ මත පොලී සහ සඵල පොලී අනුපාතිකය (1994-2023) | 361 |
| 4. ආයෝජන කළඹ පිළිබඳ ප්‍රකාශනය (1994-2023) | 362 |
| 5. සංක්ෂිප්ත මුදල් ප්‍රවාහය (මුදල් මණ්ඩලය) (1994-2023) | 363 |
| 6. සංක්ෂිප්ත ආදායම් හා වියදම් ගිණුම ප්‍රකාශනය (1999-2023) | 364 |
| 7. පැහැදිලි කිරීම් | 368 |

‘අ’ කොටස

# ආයතනික භාරකාරත්වය





# අධිපති සහ පාලක මණ්ඩලයේ සභාපතිතුමන්ගේ පණිවිඩය

සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ.) 2023 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය වෙනුවෙන් මා විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

අභියෝගාත්මක වාතාවරණයක් හමුවේ වුවද, සේ.අ.අ. 2023 වර්ෂය මුළුල්ලේ කැපීපෙනෙන කාර්යසාධනයක් පෙන්නුම් කිරීමට සමත් විය. ප්‍රධාන වශයෙන් දේශීය ස්වෛරීත්ව ණය තිරසාරභාවය පිළිබඳව පැවැති අවදානම් තත්ත්වය හමුවේ වසර ආරම්භයේ දී වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන ආරම්භ කිරීම සහ දේශීය ණය ප්‍රශස්තීකරණ වැඩසටහන සාර්ථකව නිමා කිරීමත් සමඟ, රාජ්‍ය සුරැකුම්පත් ඵලදා අනුපාතිකයන්හි පැවති අවදානම් ආන්තික අඩු වූ අතර, එමඟින් දේශීය මූල්‍ය වෙළෙඳපොළෙහි විශ්වාසනීයත්වය තවදුරටත් වර්ධනය වීය.

මෙම සංවර්ධනයන් සමඟ 2023 වසර අවසානයේ දී, සේ.අ.අ. හි ආයෝජන කළඹ රු. බිලියන 3,867.6 දක්වා පෙර වසරට සාපේක්ෂව 11.5% කින් වර්ධනය විය. ස්ථාපිත අවදානම් පාලන ව්‍යුහය තුළ ක්‍රියාත්මක වෙමින්, සේ.අ.අ. විසින් ක්‍රියාත්මක කළ විචක්ෂණශීලී අරමුදල් කළමනාකරණ උපායමාර්ග හේතුවෙන්, 2023 වසරේ සමස්ත ආයෝජන ආදායම රු. බිලියන 469 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 48.6% ක කැපීපෙනෙන වර්ධනයක් වාර්තා කළේය. මෙම ශක්තිමත් කාර්යසාධනය හේතුවෙන්, 2023 වසර අවසානයේ දී පැවැති සාමාජික ශේෂ මත 13% ක ඉහළ පොලී අනුපාතයක් ලබා දීමට සේවක අර්ථසාධක අරමුදලට හැකි වූ බව ප්‍රකාශ කරන්නේ මහත් අභිමානයෙනි.

සාමාජිකයින් හා සේවායෝජකයින් ඇතුළු අරමුදලේ විවිධ පාර්ශවකරුවන් වෙත, ඉහළ ගුණාත්මක සේවයක් ලබා දීම සඳහා සේ.අ.අ. විසින් එහි සේවා පද්ධතීන් සහ පහසුකම් නිරන්තරයෙන් වැඩි දියුණු කරන ලදී. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙස, සේවායෝජකයින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා කැපීපෙනෙන සේවායෝජක ආයතන සංඛ්‍යාවක් 'සේ.අ.අ. මාර්ගගත සේවා' භාවිතය සඳහා යොමු කළ හැකි විය. මෙමගින් සාමාජික ගිණුම් එදිනම යාවත්කාලීන කරමින් විස්තීරණ හා නිරවද්‍ය සාමාජික දත්ත පද්ධතියක් ගොඩනගා ගැනීමට අවශ්‍ය අඩිතාලම සකස් කර ගැනීමට සේ.අ.අ. ට අවස්ථාව ලැබී ඇත.

සාමාජිකයින් හට සුරක්ෂිත හා තෘප්තිමත් විශ්‍රාම දිවියක් ගතකිරීමේ හැකියාව තහවුරු කළ හැකි විශිෂ්ට සේවයක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සහ කම්කරු දෙපාර්තමේන්තුව දක්වන අපරිමිත කැපවීම, සේ.අ.අ. හි ප්‍රශංසනීය කාර්යසාධනය තුළින් පිළිබිඹු වේ. තවද, අරමුදලෙහි කළමනාකරණ කාර්යයේ නියුතු සියල්ලන් විසින් තම ක්‍රියාකාරී දායකත්වය ලබාදීම සඳහා දක්වන ලද කැපවීම හා දරන ලද වගකීම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය වෙනුවෙන් මම, මාගේ හෘදයාංගම ප්‍රශංසාව පුද කරමි. තවද, සේවක අර්ථසාධක අරමුදලෙහි භාරකරු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන්, සේවායෝජකයින් සහ අරමුදලේ සාමාජිකයින් වෙත ද මාගේ කෘතඥතාවය ප්‍රකාශ කරමි.

**ආචාර්ය පී නන්දලාල් වීරසිංහ**

පාලක මණ්ඩලයේ සභාපති

මහ බැංකු අධිපති



# කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීමේ අරමුණින් 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ස්ථාපිත කරන ලද සේවක අර්ථසාධක අරමුදලේ 2023 වර්ෂයේ අත්පත් කරගත් ප්‍රගතිය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරනු ලබන 2023 වාර්ෂික වාර්තාවට පණිවුඩය නිකුත් කරන්නේ ඉමහත් සතුටිනි.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින විශාලම සමාජ ආරක්ෂණ ක්‍රමය වන සේවක අර්ථසාධක අරමුදලේ පරිපාලන නියමුවා වශයෙන් සේවාලාභීන් වෙත කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දීමට හැකි වීම 2023 වර්ෂයේ අප ලද විශාලම ජයග්‍රහණයක් සේ සලකමි.

සේව්‍ය හා සේවක දෙපාර්ශවය වෙත කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් E - සේවාවක් හඳුන්වා දීමට කම්කරු දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී. ඒ සඳහා මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු කරමින් පවතින අතර මෙමඟින් සේවායොජකයින් ලියාපදිංචිය, සාමාජික ලියාපදිංචිය, ප්‍රතිලාභ අයදුම්පත ඉදිරිපත් කිරීම යනාදිය E - සේවාව ඔස්සේ ඉදිරිපත් කිරීමට හැකිවනු ඇත. තවද සාමාජික ලියාපදිංචිය පරීක්ෂා කිරීම ද මෙමඟින් සිදු කර ගැනීමට හැකි වන අතර ලියාපදිංචි නොවූ සාමාජිකයන් හට ABH ලියාපදිංචිය සඳහා අවශ්‍ය පියවර ගැනීමට හැකිවනු ඇත. මේ තුලින් සේවාලාභීන් වෙත වඩාත් පහසුවෙන් තම සේවාවන් සපයා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

එමෙන්ම සාමාජිකයන් ලියාපදිංචියකින් තොරව දායක මුදල් ගෙවීම හේතුවෙන් ඇතිවන ගැටළු මඟ හරවා ගැනීම සඳහා සාමාජිකයන් දින 30 ක් ඇතුලත අදාල කම්කරු කාර්යාලය වෙත ඉදිරිපත් කර ලියාපදිංචි කරවීමට සාමාජිකයාගේ හැඳුනුම්පත පරිලෝකනය කිරීම හා උඩුකය ඡායාරූපයක් ලබා ගැනීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සම්මත කරගෙන ඇත. ඒ අනුව කටයුතු කිරීම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි. එමෙන්ම මෘදුකාංගය සංවර්ධන කටයුතු ද අවසන් කර ඇති අතර එමඟින් සියලු සාමාජිකයින් මුහුණ දෙන ගැටළු රැසකට විසඳුම් ලැබෙනු ඇත.

මෙම සියලු කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා නිලධාරීන්ගේ කැපවීම අත්‍යාවශ්‍ය වන අතර මේ සඳහා සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථාපිත වගකීම් නිසිපරිදි ඉටු කිරීම වෙනුවෙන් මහඟු දායකත්වයක් ලබා දෙන කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් හා සේවක අර්ථසාධක අරමුදලේ කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා දායකත්වය ලබා දෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් හට මාගේ කෘතඥතාව පළකරමි.

මෙම දත්ත පරිශීලනය කරන පාර්ශවයන්, මෙම විෂයට අනුබද්ධව කටයුතු කරන විද්‍යාර්ථීන්, වැඩකරන ජනතාව, ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු මෙම විෂයට ඇලුම් කරන පාර්ශවයන්ට මෙම වාර්තාව මහඟු අත්වැලක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

**එච්.කේ.කේ.ඒ.ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්

සිංහල

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම
## 2023.12.31 දිනට

### සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

| අංශය | තනතුර | නම |
|---|---|---|
| අධිකාරී/සේ.අ.අ. කාර්යාලය | අධිකාරී | ඩී.එල්. නිහාල් මයා |
| | අතිරේක අධිකාරී | එස්.එම්.එල්. සිරිවර්ධන මිය |
| | අතිරේක අධිකාරී | ආර්.එම්.ඩී.සී.එම්. රාජපක්ෂ මිය |
| | නියෝජ්‍ය අධිකාරී | ඩී.පී.ඒ.එන්.ඩී. පෙරේරා මිය |
| | නියෝජ්‍ය අධිකාරී | ඩබ්ලිව්.එච්.එම්. කුමාර මයා |
| | නියෝජ්‍ය අධිකාරී | කේ.ඒ.ටී.එන්. සේනාරත්න මිය |
| | නියෝජ්‍ය අධිකාරී | ආර්.ඒ.සී.සී. රූපසිංහ මිය |
| ආයතනික සේවා හා පරිපාලන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩබ්ලිව්.එස්.එච්. කුමාරසේන මයා |
| | සහකාර අධිකාරී | කේ.ඒ.එස්.ඒ. කුරුප්පුආරච්චි මිය |
| | සහකාර අධිකාරී | ඩබ්ලිව්.එම්.ඒ. ප්‍රභාෂණී මිය |
| රැස්කිරීම් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | පී.ඩබ්ලිව්. විමල් ශාන්ත මයා |
| | සහකාර අධිකාරී | එම්.ඩබ්ලිව්.ටී. දිල්ෂාණි මිය |
| ජංගම දායක මුදල් අංශය | සහකාර අධිකාරී | ඩී.ආර්.එම්. මෙන්ඩිස් මිය |
| | සහකාර අධිකාරී | එස්.අයි.ඒ. වලවගේ මයා |
| | සහකාර අධිකාරී | එම්.ඒ.වී. විජේන්ද්‍රනී මිය |
| නැවත ලියාපදිංචි කිරීමේ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එම්.ඩබ්ලිව්.එන්. මාන්නනායක මයා |
| විද්‍යුත් දායක මුදල් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ජී.බී.එම්.පී. දිසානායක මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | බී.එම්.ජේ. විජයසුන්දර මයා |
| | සහකාර අධිකාරී | එල්.වී.එම්.එන්. අර්සකුලරත්න මිය |
| අරමුදල් කළමනාකරණ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එල්.පී.එස්. පෙරේරා මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | කේ.යූ.බී. තෙන්නකෝන් මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එල්.ඩී.එස්.ආර්. ගුණසේකර මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩී.පී. උඩුගමකෝරාල 'විය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩබ්ලිව්.ඒ.ඒ.එස්. සුමනදාස මයා |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්.එන්. වන්නිආරච්චි මයා |
| | සහකාර අධිකාරී | එම්. තුර්කාගිනි මිය |
| | සහකාර අධිකාරී | ඊ.ඒ.සී.එම්. එදිරිසිංහ මිය |
| | සහකාර අධිකාරී | කේ.වී.ඩී. සකුණිකා 'විය |
| ගිණුම් හා සැසඳීම් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එම්. දිසානායක මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩබ්ලිව්.ඒ.එන්.ඩී. ඩයස් මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඒ.කේ. චතුරංග මයා |
| | සහකාර අධිකාරී | ආර්.කේ.එම්. ප්‍රතිභානි මිය |
| වාර්තා කළමනාකරණ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩී.වයි.එස්. මහගෙදරවත්ත මිය |
| | සහකාර අධිකාරී | ටී.ටී.ඩී. පීරිස් මයා |
| | සහකාර අධිකාරී | ඩබ්ලිව්.එම්.එස්. වීරක්කොඩි 'විය |
| වාර්තා සංශෝධන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | කේ.එම්.ජී.සී. බණ්ඩාර රාජනායක මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඊ.එම්.එස්. ඒකනායක මයා |
| | සහකාර අධිකාරී | කේ.එච්. ගුණසේකර මිය |
| | සහකාර අධිකාරී | වයි.ඒ.ජේ.එන්. යාපා මිය |
| නිවාස ණය අංශය | සහකාර අධිකාරී | කේ.ඒ.ඩී.එච්.ඒ. රාජරත්න මයා |

| | | |
|---|---|---|
| ප්‍රතිලාභ පාලන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | එස්.එස්. වෙනිවැල්කොල මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | බී.ඒ.එන්. කරුණාරත්න මිය |
| ප්‍රතිලාභ ගෙවීම් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ජී.ජී.එන්.එම්. පෙරේරා මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ඩබ්ලිව්. එල්. පී. ජේ. ලේකමලාගේ මිය |
| | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | පී. ප්‍රේමසිරි මයා |
| මහජන සම්බන්ධතා, විමසීම් කවුළුව සහ ඇමතුම් මධ්‍යස්ථානය | සහකාර අධිකාරී | එස්.ජී.සී. සමරනායක මයා |



## සේවක අර්ථසාධක අරමුදල් අංශය - කම්කරු දෙපාර්තමේන්තුව

| අංශය | තනතුර | නම |
|---|---|---|
| | කම්කරු කොමසාරිස් | ඒ.එම්.පී.එන්.ඩී. සුමනසේන මිය |
| ගෙවීම් | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | ටී.එම්.අයි.ලක්මාලි මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | බී. නිරෝෂිනි මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | දිලංකා වයි.විජේතුංආරච්චි මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | සී.කේ.ඩී.එච්.මුණසිංහ මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | එන්.එම්.ඒ.නවරත්න මිය |
| අයකිරීම් | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | ඒ.එම්. ශ්‍රියාණි චන්ද්‍රිකා මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | ඒ.එච්.එල්.රූපිකා පද්මිණි මිය |
| | සහකාර කම්කරු කොමසාරිස් | පී.එම්.වික්‍රමතිලක මයා |
| 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් | සහකාර කම්කරු කොමසාරිස් | ජී.ජී.එච්.ඊ. ද සිල්වා මිය |
| පරිගණක | සහකාර කම්කරු කොමසාරිස් | ජී.සී.පී. කුමාර මයා |
| පාලන | සහකාර කම්කරු කොමසාරිස් | ටී.සී.කරුණාරත්න මිය |
| මධ්‍යම ලිපිගොනු | සහකාර කම්කරු කොමසාරිස් | ටී. ලක්ෂ්මිධරන් මයා |
| මියගිය සාමාජික ප්‍රතිලාභ ගෙවීම් | සහකාර කම්කරු කොමසාරිස් | ඩී.එම්.ටී.පී. දසනායක මිය |

# නියාමන රාමුව

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ./අරමුදල) යනු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. රජයේ විශ්‍රාම ප්‍රතිලාභ නොලබන පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සේවානියුක්තිකයින් වෙත අනිවාර්යය දායක මුදල් ගෙවීමක් සහිත විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලෙස 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධි විධාන වලට අනුව, අරමුදලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කම්කරු කොමසාරිස්තුමා කටයුතු කරන අතර, අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල, කාර්යයන් හා වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. පනත අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තමන් වෙත පැවරී ඇති බලතල, කාර්යයන් හා වගකීම ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගිනි.

අරමුදලට ලැබිය යුතු අනිවාර්ය අවම මාසික දායක මුදල් ප්‍රමාණය සේවානියුක්තිකයෙකුගේ දළ මාසික ඉපැයීම් වලින් සියයට 20 කි. සාමාජිකයාගේ දළ මාසික ඉපැයීම් වලින් සියයට 12 ක අවම ප්‍රතිශතයකට සමාන මුදලක් සේවායෝජකයා විසින් ද, සියයට 08 ක ප්‍රමාණයක් සේවකයා (සාමාජිකයා) විසින් ද දායකත්වය ලෙස දැරිය යුතු වේ. තම සේවානියුක්තිකයන් වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල් සහ අදාළ තොරතුරු නියමිත කාලසීමාව තුළ සේ.අ.අ. වෙත එවීමට සේවායෝජකයා බැඳී සිටී.

අරමුදලෙහි විශ්‍රාමික සාමාජිකයන් හට තම වයස සම්පූර්ණ වීම මත, එනම්, පිරිමින් වයස අවුරුදු 55 හා කාන්තාවන් වයස අවුරුදු 50 සම්පූර්ණ වූ විට ප්‍රතිලාභ මුදල් ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකිය. එයට අමතරව ස්ථිරව රට හැර යාම, පූර්ණ දුබලතාවයට පත්වීම, විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම (කාන්තාවන් සඳහා පමණි) සහ විශ්‍රාම වැටුප් ලබන රජයේ රැකියාවකට පිවිසීම යන හේතු ද සාමාජිකයින්ට ඔවුන්ගේ සේ.අ.අ. ගිණුම් වලින් අරමුදල් ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකිය. තවද, මියගිය සාමාජිකයන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් එම සාමාජිකයාගේ ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබයි. විශ්‍රාම ප්‍රතිලාභ වලට අමතරව, තම සාමාජික ශේෂය ඇපයට තබා අනුමත ණය දෙන ආයතන පහකින් නිවාස ණය ලබා ගැනීමට ද අරමුදල පහසුකම් සපයා ඇත. තවද, 2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත අනුව නිවාස ඉදිකිරීම් කටයුතු හා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමේ අරමුණින් ගිණුම් ශේෂය රු.300,000 වැඩි සහ සේවා කාලය වසර 10 කට වැඩි දැනටමත් දායක මුදල් ගෙවමින් පවතින සාමාජිකයන් හට තම ගිණුමේ ඇති ශේෂයෙන් උපරිමය රු. මිලියන 2 කට යටත්ව, සියයට 30 ක් ආපසු ලබා ගැනීමේ හිමිකම 2015 වසරේ සිට ලබා දී ඇත.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

සාමාජික දායක මුදල්, අධිභාර සහ ගාස්තු හා අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම භාරගෙන එය අරමුදලට එකතු කිරීම.

සාමාජිකයන්ගේ කේවල ගිණුම් පවත්වාගෙන යාම සහ සාමාජිකයන් වෙත ගිණුම් ප්‍රකාශයන් නිකුත් කිරීම.

අරමුදලේ ආරක්ෂාව තහවුරු කරන අතරම, සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභ අත්කර දීම අරමුණු කොට අරමුදල සතු අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය, ගරු කම්කරු අමාත්‍යවරයාගේ හා ගරු මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව සාමාජික ගිණුම්වලට බැර කිරීම.

අරමුදලේ වාර්ෂික ගිණුම් සැකසීම හා පොදු ගිණුම් පවත්වාගෙන යාම.

කම්කරු කොමසාරිස් විසින් ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාළ ප්‍රතිලාභ ගෙවීම.

නිවාස ණය ලබා ගන්නා සාමාජිකයින් වෙනුවෙන් ගිණුම් ශේෂ සහතික, ඇපකර ලෙස නිකුත් කිරීම සහ ශේෂ තහවුරු වැනි අනෙකුත් සේවා ලබාදීම.

යම් ගිණුම් වර්ෂයක් අවසන් වී තෙමසක් ඇතුළත අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන සහ ආයෝජන ප්‍රකාශන වැනි තොරතුරු ගරු කම්කරු ඇමතිවරයාට සහ ගරු මුදල් ඇමතිවරයාට ඉදිරිපත් කිරීම.

සාමාජික ගිණුම් ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නමින් නැවත ලියාපදිංචි කිරීම.

කම්කරු කොමසාරිස් විසින් සියයට 30 ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාළ ප්‍රතිලාභ ගෙවීම.

සාමාජික ගිණුම් තොරතුරු නිවැරදිව පවත්වාගෙන යාම සහ අවශ්‍ය වෙතොත් සංශෝධන සිදුකිරීම.

## කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාරය

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත ක්‍රියාත්මක කිරීම. ඒ අනුව,

- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා ආයතන ලියාපදිංචි කිරීම
- සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම
- දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම
- සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදු කිරීම සඳහා ගෙවීම් නියෝග ලබා දීම
- අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය
- සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගතිය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම සහතික කර ගැනීම පිණිස ක්ෂේත්‍ර පරීක්ෂණ හා විමර්ශන සිදු කිරීම
- සේවක අර්ථසාධක ගෙවීම් නොකිරීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම
- සේවක අර්ථසාධක පනතට අනුව කටයුතු නොකරන සේවායෝජකයිකන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම
- ප්‍රමාද වී ගෙවන දායක මුදල් සම්බන්ධයෙන් අධිභාර මුදල් අයකර ගැනීම
- සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව සේවා සේවක දෙපාර්ශවය ඇතුළු මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම




'ආ' කොටස

# ආයතනික විශ්ලේෂණය

# අපගේ දැක්ම

"සමෘද්ධිමත් විශ්‍රාම දිවියක්
සාමාජිකයන් වෙත
ලබා දීමට හැකිවන අයුරින්
කලාපයේ වඩාත් විශ්වාසදායී
විශ්‍රාම අරමුදල බවට පත්වීම"





# අපගේ මෙහෙවර

"නව්‍ය හා විචක්ෂණශීලි
කළමනාකරණය තුලින්
ඉහළම විශ්‍රාම ප්‍රතිලාභයක් හා
කාර්යක්ෂම සේවාවක්
සාමාජිකයන් වෙත ලබාදීම"

# ගමන්මගෙහි මංසළකුණු

**1958**

1958 අංක 15 සේ.අ.අ. පනත බලාත්මක කිරීම.

සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් සේවකයා විසින් 4% ක් සහ සේවායෝජකයා විසින් 6% ක් ලෙස ස්ථාපිත කිරීම.

**1971**

සේවකයා සහ සේවායෝජකයා විසින් සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් පිළිවෙලින් 4% සිට 6% දක්වා සහ 6% සිට 9% වැඩි කිරීම.

**1981**

සේවකයා සහ සේවායෝජකයා විසින් සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් පිළිවෙලින් 8% සහ 12% දක්වා තවදුරටත් වැඩි කිරීම.

**1988**

අනුමත ණය දෙන ආයතනවලින් නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ගේ සේ.අ.අ. ඇපයක් ලෙස යොදා ගැනීමට පහසුකම් සැලසීම.

**1996**

සේ.අ.අ. පරිගණක පද්ධතිය වන AS 400 පද්ධතිය ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ දී ස්ථාපනය කිරීම (මහ බැංකු බෝම්බ පිපිරීමෙන් පසු).

**1998**

ශ්‍රී ලංකාවේ 50 වන නිදහස් සැමරුම නිමිත්තෙන් බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති ප්‍රදර්ශනයේ දී පළමුවරට දුරස්ථව සාමාජික ශේෂ ප්‍රකාශ නිකුත් කිරීම.

**1999**

කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර මංගත සන්නිවේදන සම්බන්ධතාවය ඇති කිරීම.

**1999**

තීරණ ලිපි ඉලෙක්ට්‍රොනික හුවමාරු කිරීම ඇරඹීම.

කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රීලංකා මහ බැංකුව අතර ඩිජිටල් සන්නිවේදන සබැඳියක් පිහිටවීම.

තීරණ ලිපි කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සේ.අ.අ. දෙපාර්තමේන්තුව සමග ඉලෙක්ට්‍රොනිකව සම්බන්ධ කිරීම ඇරඹීම.

**2000**

සේ.අ.අ. හිමිකම් පෑමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා නව පරිගණක පද්ධතියක් හඳුන්වා දීම.

**2000**

අර්ධ වාර්ෂික සාමාජික ශේෂ ප්‍රකාශනයන් නිකුත් කිරීම.

**2001**

දිස්ත්‍රික් කම්කරු කාර්යාල වෙත සේ.අ.අ. ගෙවීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කිරීම.

**2002**

සේ.අ.අ. දායක මුදල් විද්‍යුත් දායක ක්‍රමය යටතේ රැස්කිරීම ඇරඹීම.

සේ.අ.අ. දෙපාර්තමේන්තුව

කම්කරු දෙපාර්තමේන්තුව

**2006**

පොදු ලෙජර, ආයෝජන සහ තොග මොඩියුල සමඟ SAP පරිගනක පද්ධතිය ස්ථාපනය කිරීම.

**2007**

සේ.අ.අ. නිල වෙබ් අඩවිය ත්‍රෛභාෂාවෙන් දියත් කිරීම.

**2008**

සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ආරම්භ කිරීම.

**2011**

ද්විත්ව කේන්ද්‍රීය පිවිසුම් ලෙජර පද්ධතියක් සහිත සාමාජික වගකීම් පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම.

සේ.අ.අ. දායක මුදල් බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා මංගතව ගෙවීමේ ක්‍රමවේදය හඳුන්වා දීම.

සේ.අ.අ. හි ශුද්ධ වත්කම් වටිනාකම රු.ට්‍රිලියන 1 මට්ටම කරා ළඟා වීම.

**2012**

සාමාජිකයින් 50 ට වැඩි සේවායෝජකයින් වෙනුවෙන් විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේ.අ.අ. තොරතුරු ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම.

**2012**

සේ.අ.අ. පනත සංශෝධනය කිරීම සහ 2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධිත) පනත මගින් අංක 23 A වගන්තිය එකතු කිරීම.

**2013**

දායක මුදල් ගෙවීම් පැහැර හැරීම සහ අධිකරණ නඩු අධීක්ෂණය කිරීම සඳහා නව පරිගණකගත පද්ධතියක් හඳුන්වා දීම.

**2015**

සේ.අ.අ. 30% හිමිකම් පෑමේ ක්‍රියාවලිය ස්ථාපිත කිරීම.

**2015**

නිවාස හා වෛද්‍යමය අරමුණු සඳහා 30% ක පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ නිදහස් කිරීමේ ක්‍රමවේදය ආරම්භ කිරීම.

විද්‍යුත් දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.

**2016**

මංගතව සේවක දත්ත සත්‍යාපනය කළ හැකි යෙදවුමක් සහිත 100% ස්වයංක්‍රීය සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම.

**2017**

දීප ව්‍යාප්ත මහජන බැංකු ශාඛා සමඟ ඒකාබද්ධ වෙමින් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමවේදය විමධ්‍යගත කිරීම.

සේ.අ.අ. හි ශුද්ධ වත්කම් වටිනාකම රු.ට්‍රිලියන 2 මට්ටම කරා ළඟා වීම.

**2021**

සේ.අ.අ. හි ශුද්ධ වත්කම් වටිනාකම රු.ට්‍රිලියන 3 මට්ටම කරා ළඟා වීම.

සේ.අ.අ. හි නිල වෙබ් අඩවිය මාර්ගගතව දායක මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ද සමඟින් නැවත දියත් කිරීම.

**2023**

රාජ්‍ය බැඳුම්කර කළඹ ප්‍රතිව්‍යුහගත කිරීම

අරමුදලෙහි භාරකරු ලෙස, අරමුදලෙහි මුදල් ආයෝජනයේදී එහි සුරක්ෂිතභාවය සහ සාමාජිකයින් වෙත අවදානමට ගළපන ලද ප්‍රතිලාභ අනුපාතිකයක් සහතික කිරීම වෙනුවෙන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව නිරන්තර වගකීමට බැඳී සිටී.

# මූලය තොරතුරු - 2023

දායක මුදල් ලැබීම්
රු. බිලියන
210.6

සාමාජිකයින් වෙත
ගෙවූ වාර්ෂික පොලී
අනුපාතය
13.00%

දළ ආදායම
රු. බිලියන
469.5

අරමුදලේ වටිනාකම
රු. බිලියන
3,857.4

සාමාන්‍ය ආයෝජන
මත වූ වාර්ෂික ප්‍රතිලාභ
ප්‍රතිශතය
12.8 %

ශුද්ධ දායක මුදල්
රු. බිලියන
(5.3)

මෙහෙයුම් වියදම
රු. බිලියන
2.3

ප්‍රතිලාභ ගෙවීම්
රු. බිලියන
215.9

සාමාජික ගිණුම් ශේෂ මත
ගෙවන ලද පොලිය
රු. බිලියන
436.8

වාර්ෂික බදු වියදම
රු. බිලියන
61.9

මෙහෙයුම් වියදම් දළ
ආදායමේ
ප්‍රතිශතයක් ලෙස
0.49 %

ශුද්ධ ආදායම
රු. බිලියන
405.2

සාමාජිකයින් හා සේවායෝජකයින් ඇතුළු අරමුදලේ විවිධ පාර්ශවකරුවන් වෙත,
ඉහළ ගුණාත්මක සේවයක් ලබා දීම සඳහා සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින්
එහි සේවා පද්ධතීන් සහ පහසුකම් වැඩි දියුණු කර ඇත.



රූප සටහන 01

## අරමුදලේ වර්ධනය




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ශුද්ධ වත්කම් (රු. බිලියන) | 2,540 | 2,824 | 3,166 | 3,459 | 3,857 |
| වර්ධන අනුපාතිකය (සියයට) | 11.0 | 11.2 | 12.1 | 9.2 | 11.5 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 02

## දායක මුදල්, ප්‍රතිලාභ ගෙවීම් සහ ශුද්ධ දායක මුදල්




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| දායක මුදල් (රු.බි) | 157.2 | 150.7 | 165.7 | 194.9 | 210.6 |
| ප්‍රතිලාභ ගෙවීම් (රු.බි) | 126.3 | 109.7 | 118.2 | 163.0 | 215.9 |
| ශුද්ධ දායක මුදල් (රු.බි) | 30.9 | 41.0 | 47.5 | 31.6 | (5.3) |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 03

## සාමාජික ගිණුම් සංඛ්‍යාව




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව | 19.39 | 19.76 | 20.34 | 21.00 | 21.50 |
| සක්‍රීය සාමාජික ගිණුම් සංඛ්‍යාව | 2.9 | 2.6 | 2.5 | 2.7 | 2.6 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 04

## ආයෝජන කළඹෙහි සංයුතිය




| සංයුතිය | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| රජයේ සුරැකුම්පත් | 93.8 | 93.4 | 93.2 | 96.9 | 96.2 |
| කොටස් | 3.0 | 2.8 | 3.8 | 2.3 | 2.7 |
| ණයකර සහ වෙනත් | 3.2 | 3.8 | 2.9 | 0.8 | 1.1 |

රජයේ සුරැකුම්පත් | කොටස් | ණයකර සහ වෙනත්

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 05

## සාමාන්‍ය ආයෝජන කළඹ මත ප්‍රතිලාභ




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| දළ ආයෝජන ආදායම (රු.බිලියන) | 259.0 | 285.4 | 342.2 | 315 | 469.3 |
| සාමාන්‍ය ආයෝජන මත ප්‍රතිලාභ (සියයට) | 10.7 | 10.6 | 11.4 | 9.51 | 12.8 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 06

## සාමාජික ගිණුම්වල වර්ෂ අවසාන ශේෂ මත ගෙවූ පොලිය




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| පොලී ගෙවීම් (රු. බිලියන) | 210.4 | 227.3 | 251.8 | 277.5 | 436.8 |
| පොලී අනුපාතිකය (සියයට) | 9.25 | 9.00 | 9.00 | 9.00 | 13.00 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 07

## සාමාජිකයන් සඳහා වූ සඵල ප්‍රතිලාභ අනුපාතය සහ වෙළෙඳපොළ පොලී අනුපාතික




මූලය :සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
වාර්ෂික වාර්තාව - 2023, ශ්‍රී ලංකා මහ බැංකුව

සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මාර්ගගත සේවාවන් මඟින්, සාමාජික ශේෂයන්,
දායක මුදල් ලැබීම්, ගෙවීම් විස්තර වැනි සේ.අ.අ. සම්බන්ධ තොරතුරු වෙත
ඇඟිලි තුඩක ප්‍රවේශයක් ලබා ගත හැකිය.



# මෙහෙයුම් තොරතුරු 2023

### 2023 වසර තුළ කරනු ලැබූ ආයෝජන

- භාණ්ඩාගාර බැඳුම්කර - රු. බිලියන 297.5
- භාණ්ඩාගාර බිල්පත් - රු. බිලියන 798.7

### 2023 අවසන් වන විට

- සාමාජික ගිණුම් - මිලියන 21.5
- සක්‍රිය සාමාජික ගිණුම් - මිලියන 2.6
- සේවායෝජකයින් - 77,651
- ජාතික හැඳුනුම්පතේ නමට අනුව නැවත ලියාපදිංචි වූ සාමාජිකයින් - මිලියන 1.7
- නිවාස ණය ඇප සහතික නිකුත් කළ සාමාජිකයින් ගණන - 13,784

### ප්‍රතිලාභ ගෙවීම් :

- වටිනාකම - රු. බිලියන 215.9
- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 221,822

### පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ :

- වටිනාකම - රු. බිලියන 25.4
- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 42,435

### විද්‍යුත් දායක මුදල් ක්‍රමය :

- සක්‍රිය සාමාජික ගිණුම් වලින් සියයට 71ක්
- මුළු මාසික සේ.අ.අ. දායකත්වයෙන් සියයට 81ක්

### සේවායෝජක, සාමාජික සහ වෙනත් පාර්ශවකරුවන්ගේ විමසීම් :

- පැමිණීම් - 184,403
- ලිපි - 1,978
- දුරකථන ඇමතුම් - 73,187
- විද්‍යුත් තැපැල් - 18,959

### කම්කරු දෙපාර්තමේන්තුව :

- සේව්‍ය හා සේවක දෙපාර්ශවය වෙත කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් E- සේවාවක් හඳුන්වා දීම.
- සාමාජිකයන් ලියාපදිංචියකින් තොරව දායක මුදල් ගෙවීම හේතුවෙන් ඇතිවන ගැටළු මඟ හරවා ගැනීම සඳහා සාමාජිකයන් දින 30ක් ඇතුලත අදාල කම්කරු කාර්යාලය වෙත ඉදිරිපත් කර ලියාපදිංචි කරවීමට, සාමාජිකයාගේ හැඳුනුම්පත පරිලෝකනය කිරීම හා උඩුකය ඡායාරූපයක් ලබා ගැනීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සම්මත කර ගැනීම.

### කම්කරු දෙපාර්තමේන්තුව :

- සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් සාමාජිකයන් හට පවතින ගැටලු නිරාකරණය කිරීම සඳහා ජංගම සේවා වැඩසටහන් දිවයින් පුරා ක්‍රියාත්මක කිරීම, අත්පත්‍රිකා බෙදා දීම හා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# 1

# සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගති සමාලෝචනය - 2023

## 1. හැඳින්වීම

2023 වසර අවසානයේ දී අරමුදලෙහි මුළු ශුද්ධ වටිනාකම රුපියල් බිලියන 3,857.4 ක් ලෙස වාර්තා වූ අතර, මෙය 2022 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 3,459.9 හා සැසඳීමේ දී සියයට 11.5 ක වර්ධනයකි. 2023 අවසන් වනවිට මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 21.5 ක් විය. දායක මුදල් එවනු ලබන සාමාජික ගිණුම් ප්‍රමාණය 2023 වසර අවසන් වනවිට මිලියන 2.6 ක් විය. එය 2022 වසරේ මිලියන 2.7 සමඟ සසඳන විට සියයට 3.7 ක අඩු වීමකි. ඒ අතර, දායක මුදල් එවනු ලබන සේවායෝජකයින් සංඛ්‍යාව 2022 අවසන් වනවිට වාර්තා වූ 73,272 සිට 2023 අවසානයේ දී 77,651 දක්වා සියයට 5.98 කින් වැඩි විය.

## 1.1 සාමාජික දායකත්ව හා විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම

2023 වසරේ දායක මුදල් ලැබීම් 2022 වසරේ දී පැවති රුපියල් බිලියන 194.59 සිට රුපියල් බිලියන 210.58 දක්වා සියයට 8.2 කින් වැඩි විය. 2023 වසරේ දී සාමාජිකයන්ට හා ඔවුන්ගේ නීතිමය උරුමකරුවන්ට ගෙවන ලද ප්‍රතිලාභ රුපියල් බිලියන 215.90 ක් වූ අතර, එය 2022 වසරේ ගෙවූ රුපියල් බිලියන 163.03 ට සාපේක්ෂව සියයට 32.4 ක වැඩි වීමකි. 2023 වර්ෂය තුළ මුළු ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව 221,822 ක් වූ අතර එය 2022 වසරේ ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව වූ 254,630 ට සාපේක්ෂව සියයට 12.9 ක අඩු වීමකි. ඒ අනුව, ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම් වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 31.56 ට සාපේක්ෂව රුපියල් බිලියන ඍන 5.3 දක්වා සියයට 116.8 ක අඩු වීමක් වාර්තා විය. පසුගිය වසරට සාපේක්ෂව, ශුද්ධ දායක මුදල්වල අඩු වීමට ප්‍රධානතම හේතුව වූයේ ප්‍රතිලාභ ගෙවීම් දායක මුදල් ලැබීම්වලට සාපේක්ෂව වැඩි ප්‍රතිශතයකින් වැඩි වීමයි.

## 1.2. සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජන කළඹ

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත (EPF පනත) මගින් මෙම පනතේ අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදලේ මුදල් සුදුසු යැයි සලකනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට සහ එවැනි සුරැකුම්පත් විකිණීමට ශ්‍රී ලංකා මහ බැංකුවට (CBSL), (පෙර පරිදි මුදල් මණ්ඩලයට) බලය ලබා දී ඇත.

සේවක අර්ථසාධක අරමුදල 2023 වසරේ දී සිය ආයෝජන ක්‍රියාකාරකම් මෙහෙයවනු ලැබූයේ අභියෝගාත්මක වෙළෙඳපොළ තත්ත්වයන් රැසක් යටතේය. එම සියලු ක්‍රියාකාරකම්

අරමුදලේ ආයෝජන මාර්ගෝපදේශයන්ට (IG) සහ උපායමාර්ගික වත්කම් විභජනයට (SAA) අනුකූලව සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල 2023 වසරේ දී වැඩි අවධානයක් යොමු කරනු ලැබුවේ භාණ්ඩාගාර බිල්පත් ප්‍රධාන කරගත් රජයේ සුරැකුම්පත් ආශ්‍රිත ආයෝජන කෙරෙහිය. දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය ආශ්‍රිතව පැවති අවිනිශ්චිතතාව එයට හේතු විය. මේ අතර, කොටස් වෙළෙඳපොළෙහි සිදු වූ ඉහළ විචලනයන් හමුවේ සේවක අර්ථසාධක අරමුදල විසින් කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනය කිරීම ද එම වසරේ දී සීමා කරන ලදී. තවද, සාංසමික ණයකර ආශ්‍රිත ආයෝජන අවස්ථා අවම මට්ටමක පැවති අතර, එහිදී සේවක අර්ථසාධක අරමුදල ද සිය සාංසමික ණය කළඹ ආශ්‍රිත ණය අවදානම අවම කිරීම සඳහා ඉහළ ණය ශ්‍රේණිගත කිරීමක් සහිත ආයතනවල ආයෝජනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කළේය.

මුදල් අමාත්‍යාංශය විසින් 2023 ජූලි 04 වන දින, දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන ප්‍රකාශයට පත්කළ අතර, ඒ යටතේ විශ්‍රාම අරමුදල් වෙත විකල්ප දෙකක් ඉදිරිපත් කරන ලදී. පළමු විකල්පය යටතේ, සේවක අර්ථසාධක අරමුදලෙහි පවතින භාණ්ඩාගාර බැඳුම්කර කළඹෙන් නිශ්චිත අවම ප්‍රමාණය 2027 වසරේ සිට 2038 වසර දක්වා කාලය තුළ කල් පිරෙන නව භාණ්ඩාගාර බැඳුම්කර 12 ක් සමඟ හුවමාරු කළ හැකිය. මෙම හුවමාරුව යටතේ සේවක අර්ථසාධක අරමුදල භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන මත උපයන ආදායම සියයට 14 ක ආදායම් බදු අනුපාතයකට යටත් වනු ඇත. සේවක අර්ථසාධක අරමුදල සිය භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු නොකිරීමට තීරණය කළේ නම්, භාණ්ඩාගාර බැඳුම්කර මත උපයන ආදායම සියයට 30 ක ස්ථිර බදු අනුපාතයකට යටත් වේ. මෙම විකල්ප ක්‍රියාමාර්ග ද්විත්වය පිළිබඳ විධිමත් විමර්ශනයකින් පසු, සේවක අර්ථසාධක අරමුදලේ භාරකරු ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අරමුදල සතු භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු කිරීමට තීරණය කරන ලදී. දීර්ඝකාලීන ඉදිරි දර්ශනයක් සහිතව අරමුදලේ සාමාජිකයන්ගේ සුභසිද්ධිය යහපත පිණිස ගනු ලැබූ මෙම තීරණයට අනුව සේවක අර්ථසාධක අරමුදල විසින් රු.බිලියන 2,667.5 ක මුහුණත අගයක් ඇති භාණ්ඩාගාර බැඳුම්කර ණය හුවමාරුව සඳහා ඉදිරිපත් කරන ලදී.

2023 වසර අවසාන වන විට, ආයෝජන කළඹේ රු.බිලියන 3,867.6 ක් වූ වටිනාකමින්, සියයට 96.2 ක් රජයේ සුරැකුම්පත් ද සියයට 2.7 ක් ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවන සමාගම් කොටස් ද සියයට 0.4 ක් සාංසමික ණයකර ද ඉතිරි සියයට 0.7 ක් ප්‍රති විකුණුම් ගිවිසුම් වලින් ද සමන්විත විය.

**සංඛ්‍යා සටහන 01** **ආයෝජන කළඹෙහි සංයුතිය 2019- 2023**

| මූල්‍ය උපකරණ අයිතමය | වටිනාකම (රු.බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| රජයේ සුරැකුම්පත් | 2,390.4 | 2,642.9 | 2,958.8 | 3,358.6 | 3,722.2 |
| කොටස් ආයෝජන | 75.4 | 79.9 | 121.1 | 80.9 | 105.5 |
| සාංගමික ණයකර | 41.9 | 34.9 | 23.9 | 23.6 | 14.1 |
| ස්ථාවර තැන්පතු | 25.0 | 55.8 | 57.2 | - | - |
| ප්‍රති විකුණුම් ගනුදෙනු | 16.0 | 16.0 | 12.3 | 3.4 | 25.8 |
| **එකතුව** | **2,548.7** | **2,829.5** | **3,173.3** | **3,466.5** | **3,867.6** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සංඛ්‍යා සටහන 01 හා රූප සටහන 08 හි පෙන්වා ඇති පරිදි රාජ්‍ය සුරැකුම්පත්, ලයිස්තුගත සහ ලයිස්තුගත නොවූ කොටස්, සාංගමික ණයකර හා මුදල් වෙළෙඳපොළ ආයෝජනවලින් සමන්විත වන සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම 2023 වසර අවසානයේ දී රුපියල් බිලියන 3,867.6 ලෙස වාර්තා වූ අතර, එය 2022 වසරේ පැවති රුපියල් බිලියන 3,466.5 ට සාපේක්ෂව සියයට 11.6 ක වර්ධනයකි.

2023 වසරේදී, ශුද්ධ සාමාජික දායකත්වය රුපියල් බිලියන ඍණ 5.3 ක අගයක් ගත් බැවින් ආයෝජන කළඹෙහි වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රුපියල් බිලියන 405.2 ක් වූ ශුද්ධ ආදායම වේ. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සංකේන්ද්‍රණය වීම, 2022 වසරේ දී පැවති මුළු ආයෝජනවලින් සියයට 96.9 සිට 2023 අග වන විටදී සියයට 96.2 දක්වා සුළු වශයෙන් පහළ යන ලදී. කෙසේ වෙතත්, කොටස් වෙළෙඳපොළෙහි ආයෝජන සංයුතිය 2022 වසරේ දී පැවති සියයට 2.3 සිට 2023 වසරේ දී සියයට 2.7 දක්වා ඉහළ යන ලදී. තවද, 2023 අග වන විටදී, ආයෝජන කළඹින් සියයට 0.4 ක් සාංගමික ණයකරවල ආයෝජනය කර ඇත. එක්දින ප්‍රති විකුණුම්, කාලීන ප්‍රති විකුණුම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ද ඇතුළත් මුළු ප්‍රති විකුණුම් ගනුදෙනු, සමස්ත ආයෝජන කළඹෙන් සියයට 0.7 ක් ලෙස 2023 වසර අවසානයට ගණනය කර ඇත.

රූප සටහන 08 ආයෝජන කළඹෙහි සංයුතිය 2019 - 2023




මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### 1.2.1 රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ

භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 3,358.6 ක් වූ අතර, එය 2023 වසර අවසානයේ දී රුපියල් බිලියන 3,722.2 දක්වා සියයට 10.8 කින් වර්ධනය විය. 2023 වසරේ දී රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹෙන් රුපියල් බිලියන 438.8 ක පොලී ආදායමක් උපයාගෙන ඇති අතර, මෙය සේවක අර්ථසාධක අරමුදලේ සමස්ථ ආදායමෙන් සියයට 93.5 ක් වේ.

### 1.2.2 සමාගම් කොටස් කළඹ

සමාගම් කොටස් කළඹ, ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස් වලින් සමන්විත වන අතර, එය 2022 වසර අවසානයට වූ රුපියල් බිලියන 80.9 ක වටිනාකමට සාපේක්ෂව 2023 වසර අවසානය වන විට රුපියල් බිලියන 105.5 දක්වා සියයට 30.4 කින් ඉහළ ගොස් ඇත. ලැයිස්තුගත සමාගම් කොටස් කළඹ 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 71.8 ක වටිනාකමට සාපේක්ෂව 2023 වසර අවසානය වන විට රුපියල් බිලියන 96.4 දක්වා සියයට 34.3 කින් වැඩි වී ඇති අතර, පිරිවැය පදනම මත අගය කරන ලද ලැයිස්තුගත නොවූ සමාගම් කොටස් කළඹෙහි ආයෝජනයට අදාළ ගනුදෙනු 2023 වර්ෂය තුළදී සිදු නොවූ හෙයින් එහි වටිනාකමෙහි වෙනසක් නොවීය. සේ.අ.අ. ලැයිස්තුගත කොටස් ආයෝජන කළඹ තුළ, බැංකු, ප්‍රාග්ධන භාණ්ඩ, පාරිභෝගික සේවා, සැපයුම් ද්‍රව්‍ය ආදී විවිධ ක්ෂේත්‍රයන්හි සමාගම්වල ආයෝජන අඩංගු වේ. කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් 2020 ජනවාරි 20 දින සිට ක්‍රියාත්මක කරන ලද ගෝලීය කර්මාන්ත වර්ගීකරණ ප්‍රමිතීන්ට (GICS) අනුව වෙළෙඳපොළ අගය මත සේ.අ.අ. ලැයිස්තුගත කොටස් ආයෝජන කළඹෙහි තොරතුරු රූප සටහන 09 මගින් දැක්වේ. 2023 වසරේ දී සේ.අ.අ. සමාගම් කොටස් කළඹ රුපියල් බිලියන 23.8 ක ශුද්ධ ලාභයක් හා රුපියල් බිලියන 3 ක ලාභාංශ ආදායමක් වාර්තා කරන ලදී.

සිංහල

රූප සටහන 09 — 2023 වසර අවසානයේ පැවති ලැයිස්තුගත කොටස් ආයෝජන කළඹේ ආංශික සංයුතිය (වෙළෙඳපොළ අගයට)




මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### 1.2.3 සාංගමික ණය කළඹ

අරමුදලෙහි සාංගමික ණය කළඹ 2023 දෙසැම්බර් අග වන විට පොත් අගය රුපියල් බිලියන 14.1 ක් වූ අතර, එය මුළු ආයෝජන කළඹෙන් සියයට 0.4 ක් විය. අරමුදල සාංගමික ණය කළඹෙන් උපයන ලද පොලී ආදායම රුපියල් මිලියන 2,324.2 විය.

### 1.2.4 ප්‍රතිවිකුණුම් ගනුදෙනු

අරමුදලේ ද්‍රවශීලතාව කළමනාකරණය සඳහා දෛනික අරමුදල් ප්‍රති විකුණුම්වල සහ මහ බැංකුවේ විවෘත වෙළඳපොළ ක්‍රියාකාරකම් කවුළුව තුළ ආයෝජනය කරනු ලබයි. 2022 වසරේ දී ඉපැයූ රුපියල් මිලියන 1,420.9 ට සාපේක්ෂව, 2023 වසරේ දී රුපියල් මිලියන 1251.1 ක පොලී ආදායමක් ප්‍රති විකුණුම් ගනුදෙනු මඟින් උපයා ගන්නා ලදී.

### 1.2.5 අරමුදලේ මුළු ආයෝජන ආදායම

අරමුදල විසින් 2023 වසරේ දී රුපියල් බිලියන 469.26 ක මුළු ආයෝජන ආදායමක් උපයා ගත් අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 48.6 ක වැඩි වීමකි (සංඛ්‍යා සටහන 02). පොලී ආදායම අරමුදලේ ප්‍රධානතම ආදායම වූ අතර එය උපලබ්ධි වූ ආයෝජන ආදායමෙන් සියයට 94.3 කි. එය 2022 වසරේ වූ රුපියල් බිලියන 349.3 සිට 2023 වසරේ දී රුපියල් බිලියන 442.4 දක්වා සියයට 26.7 කින් වර්ධනය විය. තවද, කොටස් කළඹෙන් උපයන ලද ලාභාංශ ආදායම 2022 වසරේ දී රුපියල් මිලියන 7,527.8 ක් වූ අතර, එය 2023 වසරේ දී රුපියල් මිලියන 2,997.3 ක් ලෙස සටහන් විය. තවද, සේ.අ.අ. ලැයිස්තුගත කොටස් කළඹ 2022 වර්ෂයේ දී වාර්තා කළ රු. බිලියන 40.9 ක ශුද්ධ අලාභයට සාපේක්ෂව රු. බිලියන 23.8 ක ශුද්ධ ලාභයක් 2023 වසරේ දී වාර්තා කරන ලදී.

## 1.3 සේවක අර්ථසාධක අරමුදලෙහි අවදානම් කළමනාකරණය සඳහා පාලන රාමුව

සේවක අර්ථසාධක අරමුදලද (සේ.අ.අ.) ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත ක්‍රියාකාරකම් වලට අදාළ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් කෙරෙහි අවධානය යොමු කරන අවදානම් පාලන ව්‍යුහයේ අනිවාර්ය අංගයක් ලෙස සලකනු ලැබේ. තවද

සංඛ්‍යා සටහන 02 — අරමුදලේ ආයෝජන ආදායම

| ආදායම් මූලාශ්‍රය | 2022 වටිනාකම (රු.මිලියන) | 2023 වටිනාකම (රු.මිලියන) | වර්ධනය (%) |
|---|---|---|---|
| පොලිය | 349,269 | 442,419 | 26.7 |
| ලාභාංශ | 7,528 | 2,997 | (60.2) |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ) | (40,996) | 23,836 | 158 |
| මූල්‍ය ආයෝජන හානිකරණ | (3.9) | 4.0 | 203 |
| **එකතුව** | **315,797** | **469,257** | **48.6** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වල අවසාන තීරණ ගැනීමේ අධිකාරිය ලෙස අවදානම් රුචිය සහ අවදානම් දැරිය හැකි මට්ටම් වැනි සමස්ත අවදානම් පරාමිතීන් සඳහන් කරමින් සේ.අ. අරමුදලේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපත්තිමය මග පෙන්වීමක් සපයයි. සේ.අ.අ. හි අවදානම් කළමනාකරණ ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා මුදල් මණ්ඩලය (එවකට) විසින් අදාළ ක්‍රියාවලිය මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (මු.ම.අ.අ.ක.) සහ සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව (සේ.අ.අ.ආ.අ.ක) යන ඉහළ මට්ටමේ කමිටු දෙක හරහා ස්ථාපිත කර ඇත.

මු.ම.අ.අ කමිටුව අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරිම සඳහා වගකිව යුතු අතර සේ.අ.අ. ආ.අ කමිටුව අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් වලට අදාළ ඉහළම මට්ටමේ අධීක්ෂණ අධිකාරිය සපයයි. තවද, සේ.අ. අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් වල දෛනික ආයෝජන තීරණ ගැනීමේ කාර්යය සම්බන්ධ බලතල දෙපාර්තමේන්තු මට්ටමේ කමිටුවක් වන සේ.අ.අ. ආයෝජන කමිටුවට (සේ.අ.අ.ආ.ක.) පවරා ඇත.

අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වලට අදාළ පොදුවේ පිළිගත් මූලධර්ම හා සම්මතයන්ට අනුකූලව සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ අංශයේ මධ්‍යම කාර්යාලය, ප්‍රථම පෙළ ආරක්ෂණ යාන්ත්‍රණය ලෙස දෛනික ආයෝජන කටයුතු වල අවදානම අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. තවද සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි ආයෝජන ක්‍රියාකාරකම් වලට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා මධ්‍යම කාර්යාලය වගකීම දරයි. ඒ අනුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය (ආ.ප්‍ර.ප්‍ර.), උපායමාර්ගික වත්කම් විභජනයන් (උ.ව.වි) සහ ආයෝජන මාර්ගෝපදේශයන්හි (ආ.මා) දී ඇති පරාමිතීන්ට අනුකූලව ආයෝජන ක්‍රියාකාරකම් වල පූර්ව හා පසු අනුකූලතාවයන් නිරීක්ෂණය කරනු ලැබෙන අතර යම් අවදානමක් ඇතොත් ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහළ කළමණාකරණය දැනුම්වත් කිරීම සඳහා නිරන්තර අවදානම් වාර්ථා කිරීමේ ක්‍රියාපටිපාටි අනුගමනය කරනු ලැබේ.

තවද, සමස්ත සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වලට අදාළ මූල්‍යමය නොවන අවදානම් අවම කිරීම සඳහා මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව (මූ.නො.අ.ක.ක.) ලෙස වෙනම කමිටුවක් හරහා විශේෂ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව දෙවන පෙළ ආරක්ෂණ යාන්ත්‍රණය ලෙස ස්වාධීන තක්සේරුවක් හරහා ආයෝජන පාලන ක්‍රියාවලිය සඳහා ප්‍රතිපත්ති රාමුව සැපයීම, සේ.අ. අරමුදල වෙත අවදානම් පාලන ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම, සේ.අ.අ. ආ. අ. කමිටුව, මූ.නො.අ.ක. කමිටුව, මු.ම.අ.අ. කමිටුව සහ පාලක මණ්ඩලයට අවදානම් වාර්තා කිරීම සහ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ අනුකූලතාවය විමර්ශනය කිරීම යනාදිය පිලිබඳ වගකීම දරයි.

ඒ අනුව, පවතින ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීමට සහ ආයෝජන තීරණ වලට වඩා වැඩි ස්වාධීනත්වයක් ලබා දීම සඳහා සේවක අර්ථසාධක අරමුදලේ අවශ්‍යතාවලට අනුකූලව මෙන්ම වෙළඳපල තත්ත්වයන්ට ගැලපෙන පරිදි ආ.ප්‍ර.ප්‍ර, උ.ව.වි සහ ආ.මා හි සංශෝධනයන් කිරීම සහ යාවත්කාලීන කිරීම තුළින්, අදාළ ප්‍රතිපත්තිමය උපදෙස් සහ ආයෝජන ක්‍රියාකාරකම්වලට අදාළ මාර්ගෝපදේශ සැපයීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබේ. තවද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහා බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි අංගයක් ලෙස සේ.අ. අරමුදලෙහි මූල්‍යමය නොවන අවදානම් හඳුනා ගැනීම හා වාර්තා කිරීම අඛණ්ඩව සම්බන්ධීකරණය කරයි. තෙවන පෙළ ආරක්ෂණ යාන්ත්‍රණය ලෙස අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අවදානම් සහතිකයක් සපයනු ලබයි.

වසර 2023 දී, සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි මධ්‍යම කාර්යාලය, අරමුදලෙහි ආරක්ෂාව සහ ප්‍රශස්ත ප්‍රතිලාභ තහවුරු කිරීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය, ආ.ප්‍ර.ප්‍ර, ආ.මා සහ උ.ව.වි යනාදිය මගින් සපයා ඇති පරාමිතීන් වලට අනුව අරමුදල් ආයෝජන කාර්යයන් වල අනුකූලතාවයන් විචාරය කරන ලදී. තවද, එවැනි ක්‍රියාකාරකම් වල ක්‍රමානුකූල වාර්තාකරණයන්ද ආ.මා ට අනුකූලව සිදු කරන ලදී. එසේම, රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනට හමුවේ වසර තුළ ආයෝජන වාතාවරණයේ සිදු වූ දැඩි වෙනස්කම් හේතුවෙන් සේ.අ.අ. හි ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේදී මතුවිය හැකි අවදානම් පිළිබඳව මධ්‍යම කාර්යාලය අවධාරණය කරන ලදී.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අවදානම් කළමනාකාරිත්වය සමඟ සමපාත වෙමින් එහි මූල්‍ය නොවන අවදානම් හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුව අඛණ්ඩව අවධානය යොමු කරන ලදී. ඒ අනුව, සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය නොවන අවදානම් හඳුනා ගැනීම සහ සමාලෝචනය කිරීම සහ ඒ සඳහා වන අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග තීරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වරින් වර සමාලෝචනයන් සිදු කරන ලදී.

## 1.4 මෙහෙයුම් වියදම්

2022 වසරේ දී රුපියල් මිලියන 2,133.8 සිට 2023 වසරේ දී රුපියල් මිලියන 2,304.7 ක් දක්වා සියයට 8.1 කින් මෙහෙයුම් වියදම් ඉහළ යාමට පරිපාලන වියදම්වල ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා ඇත. දළ ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් මුළු මෙහෙයුම් වියදම 2022 වසරේ දී පැවති සියයට 0.67 ට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 0.49 දක්වා පහළ ඇත (සංඛ්‍යා සටහන 03).

## 1.5 බදු වියදම්

2018 අප්‍රේල් මස පළමු දින සිට ක්‍රියාත්මක වූ 2017 අංක 24 දරන නව දේශීය ආදායම් බදු පනත හඳුන්වාදීමත් සමඟ අරමුදලෙහි ආදායම්

**සංඛ්‍යා සටහන 03 — මෙහෙයුම් වියදම්**

| අයිතමය | ශ්‍රී ලංකා මහ බැංකුව පාලක මණ්ඩලය | | | කම්කරු දෙපාර්තමේන්තුව | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022 (රුපියල් මිලියන) | 2023 (රුපියල් මිලියන) | වෙනස (%) | 2022 (රු. මිලියන) | 2023 (රු. මිලියන) | වෙනස (%) | 2022 (රු. මිලියන) | 2023 (රු. මිලියන) | වෙනස (%) |
| සේවක වියදම් | 990 | 935 | (5.6) | 474 | 460 | (3) | 1,464 | 1,394 | (4.8) |
| පරිපාලන වියදම් | 335 | 485 | 44.8 | 263 | 346 | 31.6 | 598 | 832 | 39.1 |
| වෙනත් වියදම් | 66 | 74 | 12 | 5 | 4 | (20) | 71 | 79 | 11.3 |
| **එකතුව** | **1391** | **1494** | **7.4** | **742** | **811** | **9.3** | **2,133** | **2,305** | **8.01** |
| මුළු වියදම්, දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 0.44 | 0.32 | | 0.23 | 0.17 | | 0.67 | 0.49 | |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 10
**සාමාජික ගිණුම් ශේෂ සහ ගෙවූ පොලිය**




මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

බදු අනුපාතය සියයට 10 සිට සියයට 14 දක්වා ඉහළ යන ලදී. 2022 ඔක්තෝබර් 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ වාසික පුද්ගලයින් සඳහා ලැබුණු හෝ ලැබීමට නියමිත ලාභාංශ සඳහා අදාළ ආදායම් බදු අනුපාතය සියයට 15 ක් වේ.

2022 දී මිලියන 49,982 ක්ව පැවති බදු වියදම 2023 දී රුපියල් මිලියන 61,949 දක්වා සියයට 23.9 කින් ඉහළ ගියේය.

## 1.6 සාමාජික ගිණුම් ශේෂ හා ගෙවූ පොලිය

2023 වසරේ දී රුපියල් බිලියන 436.8 ක මුදලක් සාමාජික ගිණුම්වලට බැර කරන ලදී. ඒ අනුව, සාමාජික ගිණුම් ශේෂ 2022 වසරේ පැවති රුපියල් බිලියන 3,380.6 ට සාපේක්ෂව 2023 වසරේ දී රුපියල් බිලියන 3,817.9 ක් දක්වා සියයට 12.9 කින් වර්ධනය විය. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වසර අවසානයේ පැවති සාමාජික ශේෂ මත සියයට 13.00 ක ආකර්ෂණීය පොලී අනුපාතයක් ප්‍රකාශ කිරීමට අරමුදලට හැකි විය.

## 1.7 නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ට ඇප සහතික පත් නිකුත් කිරීම

සේවක අර්ථසාධක අරමුදලෙහි (සේ.අ.අ.) සාමාජිකයන්හට නිවාස ණයක් ලබාදීමේ අරමුණින් 1988 වසරේ දී හඳුන්වා දුන් සේ.අ.අ. නිවාස ණය ඇප සහතික නිකුත් කිරීමේ යෝජනා ක්‍රමය 2023 වසරේද ක්‍රියාත්මක විය. මෙම ණය යෝජනා ක්‍රමය මගින් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව සහ සමූපකාර ග්‍රාමීය බැංකුව යනාදී සහභාගීත්ව ණය දෙන ආයතන වෙතින් අරමුදලේ සාමාජිකයන් හට කම්කරු කොමසාරිස්තුමාගේ අනුමැතිය සහිතව නිවාස ණය සඳහා අයදුම් කළ හැකිය. මෙම නිවාස ණය ක්‍රමය යටතේ 2023 වසර තුළදී රුපියල් මිලියන 10,240 ක් වූ නිවාස ණය සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස නිවාස ණය ඇප ශේෂ සහතික පත් 13,784 ක් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලදී. තවද, සාමාජිකයන් විසින් 2022 වසර තුළ නොගෙවූ ණය වාරික පියවීම සඳහා රු.මි. 4,236 කට ආසන්න මුදලක් සාමාජික ගිණුම්වලින් අය කරගනිමින් අදාළ ණය දෙන ආයතන වෙත ගෙවීම සඳහා 2023 වසරේදී කටයුතු කරන ලදී (සංඛ්‍යා සටහන 4).

සංඛ්‍යා සටහන 04
**නිවාස ණය පහසුකම**

| වසර | නිකුත් කරන ලද ඇප සහතිකපත් සංඛ්‍යාව | අනුමත කරන ලද නිවාස ණය මුදල (රුපියල් මිලියන) | නොගෙවූ ණය වාරික සඳහා අදාළ ණය දෙන ආයතන වෙත කළ පියවීම් (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 | 13,132 | 5,489 | 2,522 |
| 2016 | 12,780 | 5,414 | 2,541 |
| 2017 | 10,998 | 4,946 | 2,485 |
| 2018 | 10,036 | 4,974 | 2,759 |
| 2019 | 10,022 | 5,097 | 3,164 |
| 2020 | 8,537 | 4,497 | 3,321 |
| 2021 | 9,068 | 5,423 | 3,573 |
| 2022 | 9,443 | 6,127 | 3,669 |
| 2023 | 13,784 | 10,240 | 4,236 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සිංහල

## 1.8 නීතිය බලගැන්වීම

සේ.අ.අ. පනතට අනුව, කම්කරු දෙපාර්තමේන්තුවට අරමුදලේ සාමාන්‍ය පරිපාලනයේ වගකීම හා නීතිය බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇත. ඒ අනුව, 2023 වසරේ දී දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කාර්යාල විසින් නව සේවායෝජකයන් 7,795 දෙනෙක් හා නව සේවානියුක්තිකයන් 32,027 දෙනෙක්, සියලු පළාත් ආවරණය කරමින්, ලියාපදිංචි කර ඇත. 2023 වසරේ ලියාපදිංචි වූ සේවායෝජකයන්ගෙන් සියයට 45.4 කට වැඩි සේවායෝජකයන් පිරිසක් බස්නාහිර පළාතට අයත් විය.

පනතේ විධිවිධානවලට අනුකූලව, සේවක දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට බලය ලබා දී ඇත. ඒ අනුව, දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල විසින් රුපියල් මිලියන 7,949 ක් හා රුපියල් මිලියන 4,561 ක් පියවා ගැනීම සඳහා පිළිවෙලින් මුල් නිවේදන 13,955 ක් ද, රතු නිවේදන 9,860 ක් ද නිකුත් කර ඇත. තවද, ගෙවීම් පැහැර හරින ලද ආයතනවලින් රතු නිවේදන යවා දින 28 ක් ඇතුළත හිඟ මුදල් ආපසු ගෙවීමට අපොහොසත් වූ ආයතන 2,512 කට එරෙහිව සිදු කළ නඩු පැවරීම තුළින් රුපියල් මිලියන 633 ක් අයකර ගෙන ඇත (සංඛ්‍යා සටහන 05).

## 1.9 සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම

සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය, සාමාජිකයන්ගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය ලෙස සාමාජික දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් අරමුදලෙහි සක්‍රීය සාමාජිකයින්, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත්

**සංඛ්‍යා සටහන 05** **නීතිය බලගැන්වීම**

| විස්තරය | | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| නව ලියාපදිංචි කිරීම් | සේවායෝජකයන් | 8,930 | 5,092 | 4,222 | 5,517 | 7,795 |
| | සේවා නියුක්තිකයන් | 37,297 | 427,016 | 18,298 | 31,415 | 32,027 |
| පළාත් අනුව සේවායෝජකයන් ලියාපදිංචි කිරීම (ලියාපදිංචි වූ මුළු සේවායෝජකයන්ගේ ප්‍රතිශතයක් ලෙස) | බස්නාහිර | 42.8 | 45.1 | 50.8 | 46.6 | 45.4 |
| | උතුරු සහ නැගෙනහිර | 11.3 | 11.3 | 10.1 | 12.2 | 11.1 |
| | අනෙකුත් | 45.9 | 43.6 | 39.1 | 41.2 | 43.5 |
| මුල් නිවේදනය | නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව | 20,436 | 11,395 | 8,273 | 11,389 | 13,955 |
| | පියවාගත යුතු මුදල (රු.මි.) | 6,839 | 5,076 | 4,026 | 7,258 | 7,949 |
| රතු නිවේදනය | නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව | 13,756 | 7,742 | 7,319 | 7,917 | 9,860 |
| | පියවාගත යුතු මුදල (රු.මි.) | 5,231 | 3,884 | 3,956 | 5,241 | 4,561 |
| නඩු පැවරීම | නඩු සංඛ්‍යාව | 4,235 | 2,712 | 2,218 | 1,664 | 2,512 |
| | අයකරගත් මුදල (රු.මි.) | 547 | 329 | 557 | 826 | 633 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් අංශය, කම්කරු දෙපාර්තමේන්තුව

අංක සහ ජාතික හැඳුනුම්පතෙහි සඳහන් සම්පූර්ණ නම යටතේ නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඉහත සඳහන් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේදී ජාතික හැඳුනුම්පත් විස්තරවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම යටතේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ (DRP) දත්ත සමුදායට ලබා දී ඇති ප්‍රවේශය හරහා පහසුකම් සපයයි. තවද, සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා 2023 වසර තුළ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබුණි.

2023 වසර තුළ දී සේ.අ. අරමුදලෙහි සක්‍රීය සාමාජිකයන් 25,019 ක් මෙම ව්‍යාපෘතිය යටතේ නැවත ලියාපදිංචි කරන ලද අතර 2023 වසර අවසානය වන විට අරමුදලෙහි මුළු සක්‍රීය සාමාජිකයන්ගෙන් 1,708,703 ක ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතිය යටතේ නැවත ලියාපදිංචි කරන ලදී.

### 1.10. විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් දායක මුදල් දත්ත රැස් කිරීම

කඩදාසි රහිත පරිසරයක් තුළ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, විද්‍යුත් මාධ්‍යය ඔස්සේ දායක මුදල් විස්තර වාර්තා රැස්කිරීමේ ක්‍රමවේදයක් මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. මූලාරම්භයේදී, ස්වේච්ඡා පදනමින් ක්‍රියාත්මක වූ මෙම ක්‍රමවේදය 2012 අංක 05 දරන, සේ.අ.අ. (සංශෝධිත) පනත හරහා අනිවාර්යය කිරීම සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදන ස්ථාපිත කරන ලදී. එකී ප්‍රතිපාදන අනුව, සේවකයන් 50ට වඩා වැඩි සේවායෝජකයින් සේ.අ. දායක මුදල් විස්තර වාර්තා විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සැපයීම අනිවාර්ය වේ.

2011 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය මංගත ගෙවීමේ ක්‍රම ඔස්සේ සේවක අර්ථසාධක දායක මුදල් එක්රැස් කිරීම සඳහා පහසුකම් සැලසීම, සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ ක්‍රමවේදය තුළ පරිවර්තනීය වෙනසක් සිදු වීමට හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සේවායෝජකයින් විද්‍යුත් ක්‍රම වෙත යොමු වීමේ සැලකිය යුතු වර්ධනයක් සිදුවූ අතර, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය ද වඩාත් කාර්යක්ෂම විය. තවද, සමස්ත මෙහෙයුම් ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ සහ නියාමනය කිරීමේ ක්‍රමවේදයද, මෙම ක්‍රියාමාර්ග හේතුවෙන් වඩාත් පහසු විය. නූතන උසස් තාක්ෂණික ක්‍රම සමඟ බද්ධ වෙමින් විද්‍යුත් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමවේදය 2016 වසරේදී තව දුරටත් පුළුල් කළ අතර මංගතවද සේවක දත්ත සත්‍යාපනය කළ හැකි යෙදවුමක් සහිත ස්වයංකෘතව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් නියෝජිත බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා හඳුන්වා දෙන ලදී.

සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා සේවායෝජකයින්ට තම විද්‍යුත් වාර්තා ඉදිරිපත් කිරීමටත්, (LankaPay Online Payment Platform (LPOPP) හරහා හෝ චෙක්පතක් මඟින් හෝ සෘජු හර ක්‍රමයට අදාල ගෙවීම් සිදු කිරීමටත් පහසුකම් සැලසුන බැවින් 2021 වර්ෂය සේ.අ.අ. දෙපාර්තමේන්තුවට ඉතා වැදගත් වසරක් විය. මේ අනුව, 2023 වර්ෂය ආරම්භය වන විට ලංකා බැංකුව, මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව යන බලපත්‍රලාභී වාණිජ බැංකු මෙම නව සේවාව සඳහා සේ.අ.අ. දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වෙමින්, ඔවුන්ගේ මෙහෙයුම් සමඟ මෙම ක්‍රමවේදය ඒකාබද්ධ කරගන්නා ලදී. තවද, සම්පත් බැංකුව, DFCC බැංකුව, පැන් ඒෂියා බැංකුව, සෙලාන් බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව යන බලපත්‍රලාභී වාණිජ බැංකු ද, 2023 වර්ෂය තුළදී නව සේවාව සමඟ අත්වැල් බැඳගන්නා ලදී. මෙම නව සේවාවෙහි එක් කැපී පෙනෙන ප්‍රතිලාභයක් නම්, ගෙවීම තහවුරු වී දිනක් ඇතුළත සාමාජික ගිණුම් යාවත්කාලීනවීම සිදු වීමයි. 2023 වර්ෂය තුළ සේවායෝජකයින් 2,071 ක් සේ.අ.අ. වෙබ් අඩවිය හරහා හඳුන්වා දුන් මෙම විද්‍යුත් දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය හා සම්බන්ධ වී ඇත.

මීට අමතරව, විද්‍යුත් දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය සහ ඒ තුළින් සේ.අ. අරමුදලෙහි සාමාජිකයන්හට හා සේවායෝජකයින්හට

අත්වන ප්‍රතිලාභ පිළිබඳව සේවායෝජකයින් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ අනුව, විවිධ විෂමතා හේතුවෙන් නිසි පරිදි ගිණුම් යාවත්කාලීන කල නොහැකි වූ සාමාජිකයන්ගෙන් සියයට 40 ක් ආවරණය වන පරිදි, දෝෂ සහිත වාර්තා ඉදිරිපත් කරන ලද සේවායෝජකයන් 320 ක් සඳහා දැනුම්වත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී.

2023 අවසානය වන විට, විද්‍යුත් දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය සමඟ ලියාපදිංචි වී ඇති සාමාජිකයන් ගණන සක්‍රීය සාමාජිකත්වයෙන් සියයට 71 ක් පමණ වන අතර 2023 වසර තුළ දී මෙම ක්‍රමවේදය යටතේ රැස්කළ සමස්ත දායක මුදල රු. බිලියන 172.45 කි. මෙම මුදල සේ.අ.අ. විසින් රැස් කළ සමස්ත දායක මුදලින් සියයට 81 කි.

## 1.11 පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය

2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතට සහ 2015 වසරේදී පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද ක්‍රියාපටිපාටියන්ට අනුව, සියයට 30 ක පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය, 2015 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය සඳහා අරමුදලේ සාමාජිකයන් වෙතින් ඉහළ ඉල්ලුමක් පවතින අතර, 2023 වසර අග වනවිට 266,938 ක් වන ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙත රුපියල් බිලියන 149.4 ක මුදලක් ගෙවා ඇති අතර 2023 වසර තුලදී පමණක්, ප්‍රතිලාභීන් 42,435 ක් වෙත රුපියල් බිලියන 25.4 ක් නිදහස් කර ඇත.

## 1.12 සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම

අරමුදලෙහි ලියාපදිංචි වී ඇති සක්‍රීය සාමාජිකයින්ට ඔවුන්ගේ සේවායෝජකයන් හරහා අර්ධ වාර්ෂිකව සාමාජික ගිණුම් ප්‍රකාශ බෙදා හරිනු ලැබේ. ඒ අනුව, 2022 වසරේ පළමු භාගයට සහ දෙවන භාගයට අදාළ සාමාජික ගිණුම් ප්‍රකාශ 2023 වසරේ දී බෙදා හරින ලදී (සංඛ්‍යා සටහන 6).

## 1.13 අනෙකුත් සේවාවන්

සේ.අ.අ. දෙපාර්තමේන්තුව එහි ක්‍රියාකාරකම්වල පරිමාවෙහි සහ සේවක අර්ථසාධක අරමුදලට අදාළ සේවාවන් ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවට පැමිණෙන සාමාජිකයින් සංඛ්‍යාවෙහි වැඩි ප්‍රවණතාවක් නිරීක්ෂණය කරන ලද අතර පාර්ශවකරුවන් සමඟ විද්‍යුත් තැපැල, ලිපි සහ දුරකථනය හරහා කරන ලද සන්නිවේදනයන් ද වසර තුළ වර්ධනය වී ඇත. මෙම තත්ත්වය හමුවේ තම පාර්ශවකරුවන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීමට දෙපාර්තමේන්තුව පියවර රැසක් ගෙන ඇත.

සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් අංශය වෙත පැමිණි සාමාජිකයින්/ සේවායෝජකයින් 184,403 දෙනෙකුගේ සේවා ඉල්ලීම් ඉටු කරමින් සේවක අර්ථසාධක අරමුදලේ සියලුම පාර්ශවකරුවන් වෙත වටිනා සේවාවක් සැපයූ අතර, අනුපිළිවෙලින් දුරකථන ඇමතුම් සහ ඊ මේල් හරහා සාමාජික විමසීම් 79,187 සහ සාමාජිකයින් 18,959 කට සේවා සපයා ඇත. තවද, සාමාජිකයින්, සේවායෝජකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් විසින් දෙපාර්තමේන්තුව වෙත එවන ලද ලිපි 1,978 කට ප්‍රතිචාර දක්වන ලදී.

2023 දී, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ වාර්තා සංශෝධන අංශය විසින් සේ.අ.අ. සාමාජික ගිණුම්වලට අදාළ සේ.අ.අ. වාර්තා සංශෝධන 105,627 ක් පමණ සිදු කර ඇත. ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාල හරහා ලැබුණු නම / ජාතික හැඳුනුම්පත් සංශෝධන සඳහා ඉල්ලීම් 23,571 ක් ඇතුළුව නම් / ජාතික හැඳුනුම්පත් සංශෝධන 97,998 ක් සහ ගිණුම් සංශෝධන 7,629 ක් 2023 වසරේදී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

**සංඛ්‍යා සටහන 06** **නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශ**

| කාලපරිච්ඡේදය | සේවායෝජකයින් සංඛ්‍යාව | ප්‍රකාශ සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්) |
|---|---|---|
| 2022 පළමු අර්ධ වර්ෂය | 63,831 | 2,176,751 |
| 2022 දෙවන අර්ධ වර්ෂය | 72,000 | 2,579,208 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සිංහල

‘ඇ’ කොටස

# මූල්‍ය ප්‍රකාශන



# සේවක අර්ථසාධක අරමුදල
# ආදායම් හා වියදම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023 | | | 2022 |
|---|---|---|---|---|---|
| | | *ශ්‍රී ල.ම.බැ. | *කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පොලී ආදායම් | 6 | 442,419,326 | - | 442,419,326 | 349,269,190 |
| ලාභාංශ ආදායම් | 7 | 2,997,302 | - | 2,997,302 | 7,527,818 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය සාධන පත්‍ර මත ශුද්ධ ලාභය /(අලාභය) | 8 | 23,835,878 | - | 23,835,878 | (40,995,584) |
| මූල්‍ය වත්කම් හානිකරණය සඳහා වෙන් කිරීම් - (වැඩි/අඩු) | 9 | 4,036 | - | 4,036 | (3,941) |
| **ආයෝජන ආදායම්** | | **469,256,542** | - | **469,256,542** | **315,797,483** |
| වෙනත් ආදායම් | 10 | 239,037 | 2,069 | 241,106 | 270,418 |
| **දළ ආදායම** | | **469,495,579** | **2,069** | **469,497,648** | **316,067,901** |
| මෙහෙයුම් වියදම් | 11 | (1,494,162) | (810,537) | (2,304,699) | (2,133,782) |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ලාභ/(අලාභය)** | | **468,001,417** | **(808,468)** | **467,192,949** | **313,934,119** |
| ආදායම් බදු වියදම | 12 | (61,949,395) | - | (61,949,395) | (49,981,617) |
| **වර්ෂයේ මෙහෙයුම් ලාභය/(අලාභය)** | | **406,052,022** | **(808,468)** | **405,243,554** | **263,952,502** |
| ඉදිරියට ගෙන එන ලද රඳවා ගත් ලාභ | | | | 46,372 | 61,263 |
| ලැයිස්තුගත කොටස්වලින් උපලබ්ධි නොවූ ලාභ | | | | (23,707,153) | 41,005,190 |
| **බෙදාහැරීම සඳහා ඇති ලාභය** | | | | **381,582,773** | **305,018,956** |
| **ලාභ බෙදාහැරීම** | | | | | |
| අඩු කළා : වර්ෂය තුළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලී | | | | (8,218,285) | (6,434,802) |
| එකතු/(අඩු) කළා : ලාභ සම කිරීමේ සංචිත අරමුදලෙන්/(අරමුදලට) මාරු කිරීම | | | | 64,150,000 | (21,000,000) |
| 2023.12.31 දිනට සාමාජික ශේෂ මත පොලිය - 13.00% (2022 - 9.00%) | | | | (436,755,361) | (277,537,781) |
| **ඉදිරි වර්ෂයෙහි දී බෙදා හැරීම සඳහා ඉදිරියට ගෙනයන ලද ශේෂය** | | | | **759,127** | **46,372** |

* ශ්‍රී ල.ම.බැ., ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව නියෝජනය කරන අතර, කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අංශය නියෝජනය කරයි.

පිටු අංක 43 සිට 97 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

කළමනාකාරිත්වය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.

පාලක මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

පාලක මණ්ඩලය වෙනුවෙන්,

.........................................................

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව
දිනය : 2024 මාර්තු 20

..................

නිහාල් ඩී ලියනගේ
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2023<br>රු.000 | 2022<br>රු.000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 13 | 382,512 | 362,496 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | | 297,885 | 297,885 |
| අස්පෘශ්‍ය වත්කම් | 14 | 5,696 | 3,537 |
| කොටස් සුරැකුම්පත් | 15 | 105,517,309 | 80,940,878 |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් | 16 | 3,762,097,038 | 3,385,604,295 |
| තොගය | | 22,683 | 25,020 |
| ලැබිය යුතු පොලී | | 70,000 | 122,125 |
| ලැබිය යුතු දායක මුදල් | | 18,600,000 | 16,000,000 |
| වෙනත් ජංගම වත්කම් | 17 | 3,036,457 | 4,080,828 |
| මුදල් හා මුදල් සමාන දෑ | 18 | 5,090,003 | 4,330,788 |
| | | **3,895,119,583** | **3,491,767,852** |
| **වගකීම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | 19 | 4,870 | 4,734 |
| උපචිත වියදම් | | 773,093 | 684,900 |
| වෙනත් ජංගම වගකීම් | 20 | **36,935,795** | **31,216,978** |
| | | **37,713,758** | **31,906,612** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **3,857,405,825** | **3,459,861,240** |
| නියෝජනය කරනු ලබන්නේ,<br>සාමාජික ශේෂ | 21 | 3,817,891,512 | 3,380,616,835 |
| | | **3,817,891,512** | **3,380,616,835** |
| සංචිත | 22 | 10,157,000 | 74,307,000 |
| රඳවාගත් ලාභ | 23 | 29,357,313 | 4,937,405 |
| | | **39,514,313** | **79,244,405** |
| **අරමුදලේ මුළු ශුද්ධ වටිනාකම** | | **3,857,405,825** | **3,459,861,240** |

පිටු අංක 43 සිට 97 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
කළමනාකාරිත්වය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
පාලක මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

පාලක මණ්ඩලය වෙනුවෙන්,

..........................................
ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

..........................
නිහාල් ඩී ලියනගේ
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2024 මාර්තු 20

# සේවක අර්ථසාධක අරමුදල
# ලැබීම් හා ගෙවීම් ගිණුම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023 | | | 2022 |
|---|---|---|---|---|---|
| | | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වසරේ ආරම්භක මුදල් ශේෂය | | 4,331,447 | 2,435 | 4,333,882 | 3,102,237 |
| මුළු ලැබීම් | 24 | 619,168,869 | 848,082 | 620,016,951 | 527,413,380 |
| මුළු ගෙවීම් | 25 | (618,409,932) | (793,791) | (619,203,723) | (526,181,735) |
| වසර අවසාන මුදල් ශේෂය | | **5,090,384** | **56,726** | **5,147,110** | **4,333,882** |

පිටු අංක 43 සිට 97 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

කළමනාකාරීත්වය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.

පාලක මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

පාලක මණ්ඩලය වෙනුවෙන්,

..................................................

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

.....................

නිහාල් ඩී ලියනගේ
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2024 මාර්තු 20

# සේවක අර්ථසාධක අරමුදල
## ආයෝජන ප්‍රකාශනය

| ආයෝජන කාණ්ඩය | සටහන | මුහුණත අගය රු.000 | පිරිවැය රු.000 | සාධාරණ අගය රු.000 | ක්‍රමක්ෂය අගය රු.000 | පොත් අගය රු.000 |
|---|---|---|---|---|---|---|
| **2023 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 16.1.1 | 3,354,860,516 | 3,234,838,801 | 3,167,996,437 | 3,301,910,739 | 3,301,910,739 |
| භාණ්ඩාගාර බිල්පත් | 16.1.2 | 444,357,807 | 400,194,434 | 419,341,945 | 420,297,186 | 420,297,186 |
| සාංගමික ණය සාධන පත්‍ර | 16.2 | 13,640,570 | 13,640,570 | 13,401,341 | 14,071,177 | 14,068,769 |
| ප්‍රති විකුණුම් | 16.3 | 25,800,000 | 25,800,000 | 25,820,344 | 25,820,344 | 25,820,344 |
| ලැයිස්තුගත කොටස් | 15.1 | - | 85,779,108 | 96,376,320 | 85,779,108 | 96,376,320 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 15.2 | - | 9,640,989 | 9,140,989 | 9,640,989 | 9,140,989 |
| | | **3,838,658,893** | **3,769,893,902** | **3,732,077,376** | **3,857,519,542** | **3,867,614,347** |
| **2022 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 16.1.1 | 3,174,405,423 | 3,068,744,310 | 1,914,415,644 | 3,184,165,117 | 3,184,165,117 |
| භාණ්ඩාගාර බිල්පත් | 16.1.2 | 183,305,720 | 166,816,977 | 172,944,307 | 174,425,329 | 174,425,329 |
| සාංගමික ණය සාධන පත්‍ර | 16.2 | 22,815,660 | 22,815,660 | 22,364,078 | 23,617,119 | 23,610,953 |
| ප්‍රති විකුණුම් | 16.3 | 3,400,000 | 3,400,000 | 3,402,896 | 3,402,896 | 3,402,896 |
| ලැයිස්තුගත කොටස් | 15.1 | - | 84,909,116 | 71,799,889 | 84,909,116 | 71,799,889 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 15.2 | - | 9,640,989 | 9,140,989 | 9,640,989 | 9,140,989 |
| | | **3,383,926,803** | **3,356,327,052** | **2,194,067,803** | **3,480,160,566** | **3,466,545,173** |

පිටු අංක 43 සිට 97 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
කළමනාකාරීත්වය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
පාලක මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

පාලක මණ්ඩලය වෙනුවෙන්,

..........................................
ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

..........................................
නිහාල් ඩී ලියනගේ
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2024 මාර්තු 20

# සේවක අර්ථසාධක අරමුදල
# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023<br>රු.000 | 2022<br>රු.000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල්** | | |
| ආයෝජන මගින් ලද පොලී | 405,207,532 | 328,807,041 |
| කොටස්වලින් ලද ලාභාංශ | 3,216,720 | 3,158,973 |
| අධිභාර සහ වෙනත් ආදායම් | 7,018 | 76,022 |
| මෙහෙයුම් වියදම් සඳහා ගෙවීම් | (1,539,400) | (1,522,698) |
| අත්තිකාරම් ගෙවීම් | (8,607) | (13,541) |
| සැපයුම්කරුවන්ට හා අනෙකුත් ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම් | (4,850,002) | (3,922,234) |
| මෙහෙයුම්වලින් උත්පාදනය කරන ලද මුදල් | **402,033,261** | **326,583,563** |
| බදු ගෙවීම් | (56,680,643) | (43,838,631) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්** | **345,352,618** | **282,744,932** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල්** | | |
| මූල්‍ය වත්කම්වල ආයෝජන | (2,972,024,779) | (2,799,928,854) |
| ආයෝජන කල්පිරීම් | 2,632,643,670 | 2,487,022,087 |
| මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලද ආදායම | 154,195 | 12,692 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 2,790 | 167 |
| දේපළ පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම | (69,702) | (188,340) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය** | **(339,293,826)** | **(313,082,248)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මුදල්** | | |
| ලද දායක මුදල් | 210,582,382 | 194,593,541 |
| පොදු තැන්පතු ගිණුම - කම්කරු දෙපාර්තමේන්තුව | 76,930 | 6,703 |
| සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම් | (215,902,441) | (163,031,106) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්** | **(5,243,129)** | **31,569,138** |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්** | **815,663** | **1,231,822** |
| වර්ෂය ආරම්භක දිනට මුදල් හා මුදල් සමාන දෑ | 4,331,447 | 3,102,060 |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ - ගැළපීම්වලට පෙර** | **5,147,110** | **4,333,882** |
| ගැළපීම් : | | |
| කම්කරු දෙපාර්තමේන්තුවේ වර්ෂ අවසාන මුදල් ශේෂය | (56,726) | (2,435) |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)** | **5,090,384** | **4,331,447** |
| **සටහන අ** | | |
| දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය | | |
| අතැති මුදල් | 20 | 20 |
| මාර්ගස්ථ මුදල් | 10,000 | - |
| බැංකුවේ ඇති මුදල් | 5,080,364 | 4,331,427 |
| | **5,090,384** | **4,331,447** |
| (-) හානිකරණ සඳහා වෙන්කිරීම් | (381) | (659) |
| | **5,090,003** | **4,330,788** |

## සේවක අර්ථසාධක අරමුදල
## හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයන්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | සාමාජික ශේෂය<br>රු.000 | ගොඩනැගිලි සංචිත අරමුදල<br>රු.000 | තාක්ෂණ ප්‍රවර්ධන සංචිත අරමුදල<br>රු.000 | ලාභ සම කිරීමේ සංචිත අරමුදල<br>රු.000 | පොදු සංචිත අරමුදල<br>රු.000 | ආයෝජන ප්‍රත්‍යාගණන සංචිත<br>රු.000 | රඳවාගත් ලාභ<br>රු.000 | එකතුව<br>රු.000 |
|---|---|---|---|---|---|---|---|---|
| **2021 දෙසැම්බර්.31 දිනට ශේෂය** | **3,066,871,294** | **3,157,000** | **350,000** | **43,150,000** | **6,650,000** | **392,375** | **45,565,111** | **3,166,135,780** |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීම මත රඳවාගත් ඉපයීම්වලට මාරු කරන ලද ආයෝජන ප්‍රත්‍යාගණන සංචිත | - | - | - | - | - | (392,375) | 392,375 | - |
| **2021.12.31 දිනට ගලපන ලද ශේෂය** | **3,066,871,294** | **3,157,000** | **350,000** | **43,150,000** | **6,650,000** | **-** | **45,957,486** | **3,166,135,780** |
| 2022 වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | - | - | 263,952,502 | 263,952,502 |
| 2022 ශුද්ධ දායක මුදල් | 36,207,760 | - | - | - | - | - | - | 36,207,760 |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම්-2022 | - | - | - | - | - | - | (6,434,802) | (6,434,802) |
| ගෙවිය යුතු සාමාජික පොලී (2022 - 9.00%) | 277,537,781 | - | - | - | - | - | (277,537,781) | - |
| බෙදාහැරිය හැකි ලාභයෙන් ලාභ සමකිරීමේ සංචිතයට මාරු කිරීම් | - | - | - | 21,000,000 | - | - | (21,000,000) | - |
| **2022 වර්ෂය සඳහා දෙසැම්බර් 31 දිනට ශේෂය** | **3,380,616,835** | **3,157,000** | **350,000** | **64,150,000** | **6,650,000** | **-** | **4,937,405** | **3,459,861,240** |
| 2023 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | - | 405,243,554 | 405,243,554 |
| 2023 ශුද්ධ දායක මුදල් | 519,316 | - | - | - | - | - | - | 519,316 |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම - 2023 | - | - | - | - | - | - | (8,218,285) | (8,218,285) |
| ගෙවිය යුතු සාමාජික පොලී (2023 - 13.00%) | 436,755,361 | - | - | - | - | - | (436,755,361) | - |
| ලාභ සම කිරීමේ සංචිතයෙන් මාරු කිරීම | - | - | - | (64,150,000) | - | - | 64,150,000 | - |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | **3,817,891,512** | **3,157,000** | **350,000** | **-** | **6,650,000** | **-** | **29,357,313** | **3,857,405,825** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

සේවක අර්ථසාධක අරමුදල ("සේ.අ.අ." හෝ "අරමුදල") යනු 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ඇති කරන ලද අනිවාර්ය දායකත්ව විශ්‍රාම වැඩසටහනකි. අරමුදලේ පොදු පරිපාලක ලෙස කම්කරු කොමසාරිස්වරයා කටයුතු කරන අතර, අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල, යුතුකම් හා වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට පවරා ඇති බලතල, යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව පහසුකම් සපයනු ලබයි.

## 2. ගිණුම්කරණ පදනම

### 2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව (SLFRS සහ LKAS) සහ 1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කර ඇත.

1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ 5 (1) (ඊ) (උ) (ඌ) සහ (ඒ) වගන්ති යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදලට අදාළව පොදු ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කර එක් එක් ප්‍රකාශයේ පිටපතක් කම්කරු අමාත්‍යවරයාට යැවිය යුතු වේ.

- අ) ආදායම් හා වියදම් ප්‍රකාශනය,
- ආ) වත්කම් හා වගකීම් ප්‍රකාශනය,
- ඇ) ලැබීම් හා ගෙවීම් ප්‍රකාශනය හා
- ඈ) එක් එක් ආයෝජනයේ මුහුණත වටිනාකම, මිලදී ගත් පිරිවැය හා වෙළෙඳපොළ වටිනාකම දක්වමින් ආයෝජන ප්‍රකාශනය

### 2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ ප්‍රතිපාදන වලට අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය සතු වේ.

## 2.3 ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුමැතිය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2024 මාර්තු 20 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් බලය පවරන ලදී.

## 2.4 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS 09) මූල්‍ය උපකරණ සහ (LKAS 26) - විශ්‍රාමික ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය හා වාර්තාකරණයට අදාළ කරුණු නිසි පරිදි සලකා බලා සාධාරණ අගයට මනින ලද හෝ අවසාන නිදහස් කර ගැනීමේ අගය මත පදනම්ව කල්පිරීම දක්වා ඒකාකාර ප්‍රතිලාභ අනුපාතයක් උපකල්පනය කරමින් මනින ලද මූල්‍ය වත්කම් හැර මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

## 2.5 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල

අරමුදලේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් අරමුදලේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

## 2.6 ප්‍රමාණාත්මකභාවය, හිලව් කිරීම සහ ඉපැයීම භාවිතය

ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

එක සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක සමූහය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අයිතම හැර වෙනස් ස්වරූප අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

හිලව් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය වන හෝ අවසර ලබා දෙන විට හැර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කර නොමැත.

වැටයීම

වෙනත් විදියකින් සඳහන් කර නොමැති විට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් ආසන්නතම රුපියල් දහස් වලට වටයා ඇත.

## 2.7 විනිශ්වයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතය

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයට සහ වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම්, වියදම් අගයන් සහ අසම්භාව්‍ය වගකීම් වලට අදාළ හෙළිදරව් කිරීම් සඳහා බලපාන විනිශ්වයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකාරීත්වය විසින් සිදු කර ඇත. එම විනිශ්වයන් සහ ඇස්තමේන්තු අතීත අත්දැකීම් සහ අදාළ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි පිළිගත හැකි අපේක්ෂාවන් ද ඇතුළුව අනෙකුත් සාධක මත පදනම්

වේ. මේ නිසා සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල, මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු හා බලපවත්නා උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද පහත සඳහන් වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකාරීත්වය විසින් සලකා බලන ලදී.

**අඛණ්ඩ පැවැත්ම**

කළමනාකාරීත්වය විසින් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කරන ලද තක්සේරු කිරීමක දී නුදුරු අනාගතයක් සඳහා අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල නියැලීමට අරමුදල සතුව සම්පත් පවතින බවට තහවුරු විය. එම නිසා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව පිළියෙල කරනු ලැබේ.

මීට අමතරව පහත සඳහන් අනාවරණයන් සඳහා විශේෂිත ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගන්නා ලදී.

- මූල්‍ය සාධන පත්‍ර අගය කිරීම
- වත්කම් හානිකරණය
- දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීම
- වගකීම් සඳහා වෙන්කිරීම

### 2.8 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් හා අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී වාර්තා කරන දිනට පසුව සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා ඇත. හඳුනාගත් සියලුම වගකීම් සඳහා වෙන්කිරීම් හා අදාළ අනාවරණයන් සිදු කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 ආදායම් හා වියදම් හඳුනාගැනීම

අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒම භව්‍ය වන විට හා එම ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස මැනීමට හැකි වන විට අයභාරය හඳුනා ගැනේ. ආදායම් හා වියදම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ නිශ්චිත ආදායම් අයිතමයක ඉපයීම සහ දරන ලද පිරිවැය අතර ඍජු සම්බන්ධතාවය මත වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශය විසින් අරමුදල කළමනාකරණය වෙනුවෙන් දරන ලද සියලුම වියදම් අරමුදලෙහි වියදම ලෙස අය කරනු ලබයි.

### 3.1.1. පොලී ආදායම

ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ, සියලුම පොලී දරන මූල්‍ය සාධන පත්‍ර සඳහා පොලී ආදායම උපචිත පදනම යටතේ සඵල පොලී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් හඳුනා ගනු ලැබේ. පොලී ආදායම තුළ පොලී අනුපාතික ආදායම් හා මූල්‍ය උපකරණයන්හි වට්ටම් හෝ අධි මිල මත ක්‍රමක්ෂය වන ලාභ හෝ අලාභ ඇතුළත්ය.

### 3.1.2. ලාභාංශ

අරමුදලට ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගෙන ඇත. ලාභාංශ ආදායම ඉදිරිපත් කර ඇත්තේ නැවත අයකරගත නොහැකි රඳවාගත් බදු රහිතවය.

### 3.1.3. සාධාරණ අගයට ඇති මූල්‍ය ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීමෙන් ලද ලාභ

සාධාරණ අගයට ඇති මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයට තක්සේරු කිරීමෙන් ලද ලාභ ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස්වල සාධාරණ අගයට තක්සේරු කිරීම (වෙළෙඳපොළ තක්සේරුවට) මත උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ ලාභ වලින් සමන්විත වන අතර, එය ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය ආයෝජන සාධාරණ අගයට අගය කිරීම මගින් වූ ලාභ හෝ අලාභ යටතේ දක්වා ඇත.

### 3.1.4. සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම් තුළ අන්තර්ගත වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශයේ සියලුම කාර්ය මණ්ඩල සඳහා වැය වූ වියදම් වේ.  අරමුදල විසින් වෙනත් විශ්‍රාම අරමුදලක් හෝ වෙනත් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුම් පවත්වාගෙන නොයයි.

### 3.1.5. ආදායම් බදු

බදු අය කිරීමේ බලාධිකාරය වෙතින් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන අගය මත වත්මන් හා පෙර වර්ෂය සඳහා පවත්නා බදු වත්කම් සහ වගකීම් මනිනු ලබයි. එම මුදල ගණනය කිරීම සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති වාර්තා කරන දිනය වන විට බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද ඒවා වේ.

2018 අප්‍රේල් 01 සිට බලපැවැත්වෙන 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව, අරමුදල 14% ක ආදායම් බදු ගෙවීමට බැඳී සිටී.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමන් විසින් 2023.01.20 දින "අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම - 2023" සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක PN/IT/2023-01 නිවේදන අනුව, 2022 ඔක්තෝබර් 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාල සීමාව තුළ වාසික පුද්ගලයින් විසින් ලබාගත් හෝ ලැබීමට නියමිත ලාභාංශ සඳහා අදාළ ආදායම් බදු අනුපාතය 15% කි.

## 3.2 වත්කම්

### 3.2.1. සැලසුම් වත්කම්

අරමුදලේ සැලසුම් වත්කම් LKAS 26 ට අනුකූලව ගිණුම්ගත කර ඇති අතර, අරමුදලේ මෙහෙයුම් සඳහා භාවිතා කරන වත්කම් ඇතුළුව LKAS 26 යටතේ ඇතුළත් නොවන අනෙකුත් වත්කම් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම්ගත කර ඇත.

භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, ප්‍රති විකුණුම් ගිවිසුම්, ණයකර, ස්ථාවර තැන්පතුවල ආයෝජන වලින් සමන්විත වන අරමුදලේ ස්ථාවර ආදායම් සුරැකුම්පත් සහ ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස් සුරැකුම්පත් LKAS 26 ට අනුකූලව ගිණුම්ගත කරනු ලබයි. LKAS 26 යටතේ ඇතුළත් නොවන වෙනත් මූල්‍ය ආයෝජනයන්හි අනාගතයේ දී ආයෝජනය කරනු ලබන විටෙක SLFRS 09 යටතේ සලකා බලනු ලැබේ.

එමෙන්ම, LKAS 26 ට අනුකූලව, ස්ථිර නිදහස් කර ගැනීමේ අගයන් සහිත සහ සැලැස්මෙහි බැඳීම්, ගැළපීම් උදෙසා අත්පත් කරගනු ලැබ ඇති වත්කම් සහ සාධාරණ වටිනාකමක් ඇස්තමේන්තු කළ නොහැකි ආයෝජන හැර අනෙකුත් විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ආයෝජන සාධාරණ අගයට පවත්වා ගත යුතුය. සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කළ නොහැකි අරමුදලෙහි ආයෝජන පිළිබඳව මනාව හෙළිදරව් කර ඇත.

ඒ අනුව, කොටස් සුරැකුම්පත් පසුකාලීනව සාධාරණ වටිනාකම මත මනිනු ලබන අතර, ස්ථාවර ආදායම් සුරැකුම්පත් කල්පිරීම දක්වා ඒකාකාර ප්‍රතිලාභ අනුපාතයක් උපකල්පනය කරමින් අවසාන නිදහස් කර ගැනීමේ අගය මත පදනම් වූ ප්‍රමාණයන්ගෙන් පසුකාලීනව මනිනු ලැබේ.

ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ණය හානිකරණය මැනීම අදියර තුනක අපේක්ෂිත ණය අලාභ ආකෘතිය මත පදනම්ව සිදු කරන අතර (සටහන 3.2.1.2), සාධාරණ වටිනාකම මත මනිනු ලබන මූල්‍ය ආයෝජන සඳහා කිසිදු ණය හාණිකරණයක් ගණනය නොකෙරේ.

### 3.2.1.1. සැලසුම් වත්කම් හඳුනාගැනීම් සහ ඉවත් කිරීම.

අරමුදල අදාළ උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවලට අනුකූලව පාර්ශවකරුවෙකු වන විට, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනා ගනී. ණයගැතියා වෙත අදාළ මුදල ලබා දෙන විට හෝ පිය වූ විට, ණය සහ ලැබිය යුතු අගයන් හඳුනා ගැනේ.

වත්කමක ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ කල් ඉකුත් වූ විට හෝ වත්කමක අවදානම් සහ ප්‍රතිලාභවල හිමිකාරීත්වය හුවමාරු වන ගනුදෙනුවක් මගින් මූල්‍ය වත්කමට අදාළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය හුවමාරු වනවිට, මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හරිනු ලබයි. හුවමාරු කරන ලද මූල්‍ය වත්කමකට අදාළව අරමුදල මගින් නිර්මාණය කළ හෝ රඳවාගත් බැඳීමක් ඇති විටෙක එය වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී.

මූල්‍ය වගකීමකට අදාළ කොන්ත්‍රාත්තුව අවසන් වූ විටෙක, කල් ඉකුත් වූ විටෙක හෝ අරමුදල විසින් ඊට අදාළ වගකීම් ඉටු කරන ලද විටෙක එම මූල්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් හඳුනා ගැනීම අත්හරිනු ලැබේ.

### 3.2.1.2. මූල්‍ය වත්කම් හානිකරණය

සේ.අ.අ. විසින් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ (ECLs) මැනීම සඳහා අදියර තුනක ප්‍රවේශයක් යොදා ගනී.

- කල්පිරීම දක්වා ඒකාකාර ප්‍රතිලාභ අනුපාතයක් උපකල්පනය කරමින් අවසාන නිදහස් කර ගැනීමේ අගය මත පදනම්ව ගණනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත්,
- ණය බැඳීම්, සහ
- මූල්‍ය ඇපවීම් ගිවිසුම්

කොටස් ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ හඳුනාගෙන නැත.

මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානම වෙනස්වීම මත පදනම්ව මූල්‍ය වත්කම් පහත සඳහන් අදියර තුන යටතේ සලකනු ලබයි.

අදියර 1 - මාස 12 අපේක්ෂිත ණය අලාභ

මූලික හඳුනා ගැනීමේ දින සිට ණය අවාදානම සැලකිය යුතු අන්දමට වැඩිවී නොමැති අස්තිත්ත්වයන් සහ ආරම්භයේ සිටම ණය හානිකරණය නොවූ අස්තිත්ත්වයන් සඳහා ජීව කාලය තුළ අපේක්ෂිත ණය අලාභයේ කොටස ඉදිරි මාස 12 තුළ සිදුවන ණය පැහැර හැරීමේ සම්භාවිතාව සිද්ධි හරහා හඳුනා ගැනේ.

සැලකිය යුතු ලෙස ණය හානිකරණයට ලක් නොවූ ගනුදෙනුකරුවන්ගෙන් සේ.අ.අ. විසින් මාස 12 ක අපේක්ෂිත ණය අලාභ තීරණය කරනු ලබයි.

අදියර 2 - ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභය - ණය හානිකරණය නොකළ.

මූලික හඳුනා ගැනීමේ දින සිට ණය අවදානම සැලකිය යුතු අන්දමට වැඩි වී ඇති නමුත් ආරම්භයේ සිටම ණය හානිකරණය නොවූ අස්තිත්ත්වයන් සඳහා ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභය (මූල්‍ය වත්කමෙහි ඉතිරි ආයු කාලය පිළිබිඹු කරමින්) හඳුනා ගැනේ.

සේ.අ.අ. හි ප්‍රතිපත්තිවලට අනුකූලව, BBB- ට ශ්‍රේණියට වඩා පහළින් ශ්‍රේණිගත කර ඇති ආයෝජන, පහළ ආයෝජන ලෙස ශ්‍රේණියික ආයෝජන ලෙස සලකනු ලබන අතර, එම ආයෝජන සැලකිය යුතු ලෙස ණය පිරිහීමට ලක්වී ඇතැයි සලකයි. එවැනි ආයෝජන ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා සලකනු ලැබේ.

තවද, ඉහළ ආයෝජන ශ්‍රේණිගත කිරීම් තුළ සිදුවන විචල්‍යයන් මගින් ණය අවදානම සැලකිය යුතු ලෙස පිරිහීමට ලක්වේ. මුල්වරට හඳුනා ගැනීමේ සිට බාහිර ණය ශ්‍රේණිගත කිරීම් 02 ක් පහත වැටී ඇති ප්‍රතිපාර්ශවයන්ගේ ආයෝජන සැලකිය යුතු පිරිහීම මැනීමට භාජනය වේ.

ස්වෛරී උපකරණ සඳහා සැලකිය යුතු පිරිහීම අර්ථ දැක්වෙන්නේ ප්‍රති පාර්ශවයේ බාහිර ණය ශ්‍රේණිගත කිරීම්වල 04 ක් පහළ වැටී ඇති විටදීය.

අදියර 3 - ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභය - ණය හානිකරණය කළ.

යම් අස්තිත්ත්වයන්ගේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයක පිරිහීමකට බලපාන සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදු වූ විට අදාළ හානිකරණය තක්සේරු කෙරේ. ණය හානිකරණ වූ අස්තිත්ත්වයන් සඳහා ජීව කාලය පුරාම අපේක්ෂිත ණය අලාභය හඳුනාගන්නා අතර, පොලී ආදායම ගණනය කරනු ලබන්නේ ධාරණ අගයට වඩා ක්‍රමක්ෂය පිරිවැයට (ශුද්ධ වෙන්කිරීම්) එළදායී පොලී අනුපාතය යෙදීමෙනි.

**හානිකරණ මට්ටම තීරණය කිරීම**

සෑම වාර්තා කරන දිනයකදීම සේ.අ.අ. විසින් මූලික හඳුනා ගත් දින සිට වාර්තා කරන දින දක්වා අපේක්ෂිත ජීව කාලය තුළ දී පැහැර හැරීමේ අවදානම සංසන්දනය කරමින් අස්තිත්ත්වයන්ගේ ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් ඇතිදැයි තක්සේරු කරනු ලබයි. මේ සඳහා සේ.අ.අ. විසින් අනවශ්‍ය පිරිවැයක් හෝ වෑයමක් නොමැතිව ලබාගත හැකි සාධාරණ හා අනුමත කළ හැකි තොරතුරු යොදා ගනී. මේ සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සහ ඉදිරි දැක්මක් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් වේ.

සේ.අ.අ. විසින් අස්තිත්ත්වයන් හි ණය අවදානම තනි තනි ලෙස හෝ සාමූහික පදනමින් වැඩිවී ඇත්දැයි තක්සේරු කරනු ලැබේ. හානිකරණය පිළිබඳව සාමූහික විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා මූල්‍ය උපකරණ හවුල් ණය අවදානම් ලක්ෂණ මත පදනම්ව, ණය අවදානම් ශ්‍රේණිගත කිරීම්, මූලික හඳුනා ගැනීමේ දිනය කල්පිරීමේ කාලය, ණය ගැනුම්කරුගේ අංශය සහ අනෙකුත් අදාළ සාධක සාලකිල්ලට ගනිමින් තක්සේරු කරනු ලබයි.

**අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම.**

අපේක්ෂිත ණය අලාභය අපක්ෂපාතී හා බරිත සම්භාවි ඇස්තමේන්තුගත අපේක්ෂිත අලාභය මතින් ව්‍යුත්පන්න කර ඇති අතර, ඒවා පහත පරිදි ගණනය කරනු ලබයි.

- වාර්තා කරන දිනයේ දී ණය හානිකරණය වාර්තා නොකළ මූල්‍ය වත්කම් : සඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කරන ලද මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ආයුකාලය පුරා ඇති සියලුම මුදල් හිඟයන්ගේ වර්තමාන වටිනාකමයි. මුදල් හිඟයේ වෙනස වනුයේ ගිවිසුම් වලට අනුව සේ.අ.අ. ට ලැබීමට නියමිත මුදල් ප්‍රවාහයන් සහ සේ.අ.අ. ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනසයි.
- වාර්තා කරන දිනයේ දී ණය හානිකරණය වාර්තා කළ මූල්‍ය වත්කම් : දළ ධාරණ අගය සහ සඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය අතර වෙනසයි.
- ලබා නොගත් ණය බැඳීම් : බැඳීම් පැහැර හැරියහොත් සේ.අ.අ. ට ගෙවීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් සහ සේ.අ.අ. ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනසෙහි වර්තමාන අගයයි.
- මූල්‍ය ඇපකාර ගිවිසුම් : හිමිකරුට ප්‍රතිපූරණය කිරීම සඳහා අපේක්ෂිත ගෙවීම් වලින් සේ.අ.අ. අයකර ගැනීමට අපේක්ෂා කරන මුදල අඩු කරගත් පසු ලැබෙන අගයයි.

සේ.අ.අ. විසින් ඉදිරි දැක්මක් සහිත තොරතුරු යොදාගෙන අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා සටහන 30 හි මූල්‍ය වත්කම්හි ණය ගුණාත්මකභාවය බලන්න.

අපේක්ෂිත ණය අලාභයන් ආදායම් ප්‍රකාශනයේ අඩමාන ණය වෙන්කිරීමේ ගිණුම යටතේ හඳුනාගනී. සේ.අ.අ. අඩු කරන ලද වෙන් කිරීම් ලාභ අලාභ ගිණුම යටතේ හඳුනා ගන්නා අතර, අනුරූප වටිනාකම වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගනිමින්, සේ.අ.අ. ශේෂපත්‍රයේ සඳහන් වත්කමේ ධාරණ අගයේ අඩු කිරීමක් සිදු නොකරයි.

**3.2.1.3. හිලව් කිරීම**

හිලව් කිරීමට නෛතික අයිතියක් ඇතිවිට සහ ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට අදහසක් ඇතිවිට හෝ වත්කම උපලබ්ධි කිරීමට සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන විට දී පමණක් සේ.අ.අ. විසින්, මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ශුද්ධ අගය මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කරයි.

### 3.2.1.4. වැදගත් ගිණුම්කරණ උපකල්පන සහ ඇස්තමේන්තු

එක් එක් වාර්තාකරණ දිනයේ දී කරන ලද උපකල්පන එම දිනයේ දී වඩාත් උචිත ඇස්තමේන්තු මත පදනම් වේ. ඇස්තමේන්තු විශ්වාසනීයව මිනුම් කර ඇති බව සහතික කර ගැනීම සඳහා සේ.අ.අ. හි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇතත් තත්‍ය අගයන් එම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ පාදකව පවත්නා උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන ඇස්තමේන්තු, සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය තුළ දී සහ බලපාන ඕනෑම අනාගත කාලපරිච්ඡේදයක් තුළ දී හඳුනා ගැනේ.

විනිශ්චය, ඇස්තමේන්තු හා උපකල්පන මත පදනම් වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

**සාධාරණ අගය මැනීම**

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගනුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවකදී මිනුම්ගත කරන ලද දිනට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල් හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදලයි.

මූල්‍ය වත්කමක් හෝ වගකීමක් වර්ගීකරණය කිරීමෙන් පසු එය සාධාරණ අගයට මනිනු ලබන විටදී හැකි සෑම අවස්ථාවකදීම සේ.සේ.අ. ට පිවිසිය හැකි වඩාත්ම වාසි සහගත සක්‍රිය වෙළෙඳපොළ මගින් ඉදිරිපත් කළ ලංසු හෝ පිරිනැමීමේ මිල අනුව සාධාරණ අගය මනිනු ලැබේ. ණය අවදානම සඳහා වන ගැලපීමක් ද, සුදුසු පරිදි සාධාරණ අගයට ඇතුළත් කරනු ලබයි.

ශුද්ධ විවෘත තත්ත්වයක් වන සක්‍රීය වෙළෙඳපොළක ලැයිස්තුගත කර ඇති මූල්‍ය වගකීමක හෝ මූල්‍ය වත්කමක සාධාරණ අගය පිළිවෙලින් එහි මිල හෝ ලංසු මිල අදාළ උපකරණයේ රඳවා තබා ඇති නිකුත් කරන ලද ඒකක ගණනින් ගුණ කළ විට ලබාගත හැක.

යම් වත්කමක් හෝ වගකීමක් සඳහා සක්‍රිය වෙළෙඳපොළක් නොපවතින අවස්ථාවලදී අදාළ සාධාරණ අගයට එළඹීම සඳහා සේ.අ.අ. විසින් අතේ දුරින් වන ගනුදෙනු වලදී භාවිතා කරන ලද ගනුදෙනු මිල, වට්ටම් කළ මුදල් ප්‍රවාහ විශ්ලේෂණ, විකල්ප මිල වරණ ආකෘති, වෙනත් තක්සේරු කරන කරන ශිල්පක්‍රම, වාර්තාකරණ දිනයේ දී පවතින වෙළෙඳපොළ තත්ත්වයන් සහ අවදානම, පාදක කරගත් තක්සේරුකරණ ක්‍රමයක් භාවිතා කරනු ලබයි. එසේ යොදාගත් තක්සේරුකරණ ක්‍රමවේදය මගින් සාධාරණ අගය තක්සේරු කරන විටදී වෙළෙඳපොළ යෙදවුම් උපරිම ලෙස භාවිතා කරන අතර ආයතනය විශේෂිත වූ යෙදවුම් මත අවම විශ්වාසයක් තබයි.

කෙසේ වෙතත්, සටහන 16 හි විස්තර කර ඇති පරිදි ලැයිස්තුගත නොකළ කොටස් එහි සාධාරණ අගයට තබා ඇති අතර, තක්සේරුකරණ ක්‍රම භාවිතයෙන් විශ්වාසදායක ලෙස සාධාරණ වටිනාකම මැනීමට ප්‍රමාණවත් හා මෑත කාලීන තොරතුරු නොමැති නිසා පිරිවැය, සාධාරණ අගය සඳහා පවතින හොඳම ඇස්තමේන්තුව ලෙස සලකයි. තවද, ලැයිස්තුගත නොකළ කොටස් ආයෝජන වල ඇස්තමේන්තුගත සාධාරණ අගයන් සටහන 31 මගින් පෙන්වා දී ඇත.

### 3.2.2 දේපළ, පිරියත හා උපකරණ (දේ. පි. උ)

**හඳුනාගැනීම**

වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින විට හා වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීම සිදු වේ.

**මැනීම**

ආරම්භයේ දී සියලුම දේපළ පිරියත හා උපකරණ එහි පිරිවැයට අගය කරනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීමට ඍජුව දායක වන වියදම් හා පසුව දරන පිරිවැය (''පසුකාලීන පිරිවැය'' යටතේ පැහැදිලි කර ඇති ආකාරයට), පිරිවැයට ඇතුළත් වේ. උපකරණයක ක්‍රියාකාරීත්වයට අවශ්‍යව මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

**පිරිවැය ආකෘතිය**

දේපළ, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයට, ශුද්ධ සමුච්චිත ක්ෂය වීම් වලට හා සමුච්චිත හානිකරණ අලාභ වලටය. වත්කමක ධාරණ අගය, ඇස්තමේන්තුගත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි වන විට ධාරණ අගය අයකර ගත හැකි අගය දක්වා කපා හරිනු ලබයි. කරුණාකර සටහන 3.2.6 ට මූල්‍ය නොවන වත්කම් හානිකරණය සටහන බලන්න.

**පසුකාලීන පිරිවැය**

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටසක් කාලානුරූපීව ප්‍රතිස්ථාපනය කළ යුතු විටදී, අරමුදල විසින් ප්‍රතිස්ථාපනය කළ කොටස් පොත් වලින් ඉවත් කරන අතර, නව කොටස එයට සම්බන්ධ ආයු කාලය අනුව හඳුනා ගෙන ඒ අනුව ක්ෂය කරනු ලැබේ. ඉදිරියට යන අළුත්වැඩියා හා නඩත්තු වියදම් ඒවා දරණ ආකාරය අනුව ලාභය හෝ අලාභයට අය කරනු ලැබේ.

**ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ අයිතිමයක් විකිණීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ එය භාවිතයෙන් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ නොමැති නම් ඉවත් කරනු ලැබේ. වත්කමක් ඉවත් කිරීම මත

හඳුනාගත් කුමන හෝ ලාභයක් හෝ අලාභයක් එම වත්කම ඉවත් කළ කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභ තුළ ඇතුළත් වේ.

**ක්ෂය**

වත්කමෙහි ඇස්තමේන්තුගත සඵල ජීවකාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම සිදු කරයි. වත්කමක් ක්ෂය කිරීම ආරම්භ කරන්නේ එය පාවිච්චි කිරීම සඳහා ආදායම් තත්ත්වයට ගෙන ආ පසුව දී හෝ තමන් විසින්ම ඉදිකළ වත්කමක් සම්බන්ධයෙන් වන විට එම වත්කම සම්පූර්ණ කළ විට හා භාවිතය සඳහා සූදානම් අවස්ථාවේ සිටය. වත්කම විකුණා දැමීම සඳහා තබා ගන්නා වත්කම් ලෙස වර්ගීකරණය කළ දිනය හෝ වත්කම ඉවත් කළ දිනය යන දෙකෙන් කලින් එළඹෙන දිනයේ දී වත්කමක් ක්ෂය කිරීම නවතා දමයි.

වත්කම් සඳහා ඇස්තමේන්තුගත ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

| **වත්කම් වර්ගය** | **ක්ෂය අනුපාතය** |
|---|---|
| ගොඩනැගිලි | 02% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% |
| කාර්යාල උපකරණ | 25% |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10% |
| මෝටර් රථ | 20% |
| පරිගණක උපාංග | 25% |
| වෙනත් | 20% |

අවශේෂ වටිනාකම්, ඵලදායී ජීවකාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය එක් එක් මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම සමාලෝචනය කරන අතර, අවශ්‍ය විටදී ගැළපීම් සිදු කරනු ලැබේ.

**3.2.3. අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක මෘදුකාංග, සම්බන්ධිත දෘඩාංග වල සංකලිත කොටසක් නොවන විට, අස්පෘශ්‍ය වත්කමක් ලෙස එහි පිරිවැයට හඳුනා ගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසු අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ පසු අගයට ඉදිරියට ගෙන යනු ලබන්නේ වත්කමෙහි ඵලදායී ජීව කාලය වර්ෂ 03 ක් ලෙස පදනම් කර ගනිමිනි.

**3.2.4. තොගය**

තොග පවත්වාගෙන යනු ලබන්නේ බර තැබූ සාමාන්‍ය පිරිවැයට වන අතර, එය පරිභෝජන ද්‍රව්‍ය වලින් සමන්විත වේ.

### 3.2.5. ලැබිය යුතු මුදල්

හානිකරණය සඳහා වෙන් කිරීම් සිදු කිරීමෙන් පසු අපේක්ෂිත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ දක්වා ඇත. සියලුම ලැබිය යුතු දෑ හානිකරණය වූවා ද යන්න පිළිබඳ කිසියම් විෂය මූලික සාක්ෂි තිබේ දැයි තක්සේරු කරනු ලැබේ.

### 3.2.6. මූල්‍ය නොවන වත්කම් හානිකරණය

අරමුදල විසින් සෑම කාලපරිච්ඡේදයක් අවසානයේ දීම යම් සිදුවීමක් හෝ වාතාවරණයෙහි සිදුවන වෙනස්වීමක් නිසා මූල්‍ය නොවන වත්කමක් හානිකරණය වී ඇති බවට ඇඟවීමක් තිබේ දැයි තක්සේරු කරනු ලැබේ. එවැනි ඇඟවීමක් පවතින්නේ නම් ආපසු අයකර ගත හැකි අගය පිළිබඳ මූල්‍ය ඇස්තමේන්තුවක් අරමුදල විසින් කරනු ලබයි. එම ආපසු අයකර ගත හැකි අගයට වඩා එහි ධාරණ අගය වැඩි නම්, එම වත්කම හානිකරණය වූ බවට සලකා ආපසු අයකර ගත හැකි අගය දක්වා ලියාහරිනු ලැබේ.

## 3.3. වගකීම්

### 3.3.1. රඳවාගත් ප්‍රතිලාභ

රඳවාගත් ප්‍රතිලාභ යටතේ දක්වා ඇති අගයන් කම්කරු කොමසාරිස්වරයාගේ උපදෙස් මත රඳවාගත් ප්‍රතිලාභ වන අතර, ඔහු විසින් නැවත ඉල්ලා සිටින විට නිදහස් කරනු ලබයි. මෙවැනි බැර කිරීම් එම ගිණුමේ පවත්වාගෙන යනු ලබන්නේ එක් ගිණුම් කාලපරිච්ඡේදයක් සඳහා පමණක් වන අතර, ඉන් පසුව හිමිකම් නොපෑ ප්‍රතිලාභ ගිණුමට මාරු කරයි.

### 3.3.2. හිමිකම් නොපෑ ප්‍රතිලාභ

සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම සාමාජිකයන්ට හෝ අර්ථලාභීන්ට ලබා දුන් නමුත් විවිධ හේතු මත ආපසු එවූ හා රඳවාගත් ප්‍රතිලාභ ගිණුමේ වසරකට වඩා රඳවා ගනු ලැබූ ප්‍රතිලාභ නැවත ලබා දෙනතුරු හිමිකම් නොපෑ ප්‍රතිලාභ ගිණුමට බැර කරන ලදී.

### 3.3.3. ඌන සහ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් (ආපසු ගෙවීම්)

ඌන සහ අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් ගිණුමේ ශේෂයෙන් පෙන්වන්නේ කොටස් වශයෙන් කළ යුතු ප්‍රතිලාභ ගෙවීම් වේ.

### 3.3.4. ඌන සහ අතිරික්ත දායක මුදල් ගෙවීම් (දායක මුදල්)

සාමාජික ගිණුම්වලට බැර කෙරෙන තෙක් සාමාජික මුදල් ලැබීම් වාර්තා කරනු ලබන ශේෂය මෙහි නිරූපනය වේ.

3.3.5. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අරමුදලට ප්‍රවර්ථන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විටෙක සහ එම බැඳීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභ වලින් යුතු සම්පත් පිටතට ගලා යෑම අවශ්‍ය වීම ගම්‍ය වන විටෙක සහ බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කළ හැකි විටෙක ප්‍රතිපාදනයක් ලෙස හඳුනා ගනු ලැබේ.

3.3.6. වගකීම් හඳුනාගැනීම අත්හැරීම

හඳුනාගත් වගකීමක් අත්හරිනු ලබන්නේ එහි පැවැත්ම අහෝසි වන තත්ත්වයට පත් වූ විට වේ. එනම්, ගිවිසුමේ නිශ්චය කර ඇති බැඳීම් ක්‍රියාත්මක කිරීමෙන් හෝ අවලංගු කිරීමෙන් හෝ කල් ඉකුත්වීමෙන් පසුවය.

### 3.4. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

"ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන" හි සඳහන් ඍජු ක්‍රමය අනුගමනය කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරනු ලබයි. මුදල් හා මුදල් සමාන දෑ යන්නට අගය වෙනස්වීම් සම්බන්ධයෙන් නොසැලකිය හැකි තරමේ අවදානමකට භාජනය වන නිශ්චිත මුදල් වටිනාකමකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටිකාලීන ඉතා ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් ආයෝජන ඇතුළත් වේ.

### 3.5. ලැබීම් හා ගෙවීම් ගිණුම

ලැබීම් හා ගෙවීම් ප්‍රකාශනය තුළින් වර්ෂය තුළ මුදලින් වූ සියලුම ලැබීම් හා මුදලින් වූ සියලුම ගෙවීම් නිරූපණය කරයි.

## 4. සංසන්දනාත්මක තොරතුරු

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සහ ප්‍රවර්ථන වර්ෂයේ තොරතුරු සමඟ සංසන්දනය කිරීම සඳහා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය අවශ්‍ය අවස්ථාවන්හි දී සංශෝධනය කර ඇත (සටහන 32 - සංසන්දනාත්මක තොරතුරු).

## 5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

5.1. මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති අවස්ථාවන්හි හැර, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදවලට අදාළව අරමුදල විසින් සටහන් 01 සිට 04 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව, අඛණ්ඩව කටයුතු කර ඇත.

5.2. මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන් හට වඩාත් ඵලදායී තොරතුරු ලබා දීමේ අරමුණින් 2023 සිට විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සඳහා විශේෂිත වූ LKAS 26 ප්‍රමිතය අරමුදලෙහි ගිණුම් තැබීම සඳහා භාවිතා කරන ලදී. තවද, LKAS 26 හි ඍජු මාර්ගෝපදේශ නොමැති විට මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්හට සවිස්තරාත්මක තොරතුරු සැපයීම සඳහා SLFRS 09 හි ප්‍රතිපාදන සලකා බලන ලදී.

5.3. කෙසේ වෙතත්, සටහන් 32 හි විස්තර කර ඇති වර්ගීකරණ වෙනස්කම් හැර මූල්‍ය වත්කම් මැනීමේ පදනම සහ 2022 මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇති අගයයන් වෙනස් නොවේ. 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශුද්ධ වත්කම් තත්ත්වය නොවෙනස්ව පවතින අතර 2022 වර්ෂය සඳහා වාර්තා කරන ලද ලාභයට හෝ අලාභයට කිසිදු බලපෑමක් නැත. එම නිසා, මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කර නොමැත (not restated).

5.3.1. ස්ථාවර නිදහස් කර ගැනීමේ අගයක් ඇති සහ සැලැස්මේ වගකීම්වලට ගැළපෙන පරිදි අත්පත් කරගෙන ඇති සුරැකුම්පත් හෝ එහි නිශ්චිත කොටස් කල්පිරීම දක්වා ඒකාකාරී ප්‍රතිලාභ අනුපාතයක් උපකල්පනය කරමින් ඒවායේ අවසාන නිදහස් කර ගැනීමේ අගය මත පදනම් ප්‍රමාණයන්ගෙන් පවත්වාගෙන යා හැකිය. 1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ 5 (1) (ඉ) වගන්තිය යටතේ පනතේ සඳහන් අරමුණු සඳහා ක්ෂණිකව අවශ්‍ය නොවන අරමුදල් ආයෝජනය කිරීමට සේ.අ.අ. ට අවසර ලබා දී ඇත.

එබැවින්, සේ.අ.අ. ආයෝජන සිදු කරනු ලබන්නේ ඕනෑම අවස්ථාවක සාමාජික වගකීම් පියවීමට හැකිවන පරිදිය. එබැවින්, ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජන, කල්පිරීම දක්වා ඒකාකාරී ප්‍රතිලාභ අනුපාතයක් උපකල්පනය කරමින් ඒවායේ අවසාන නිදහස් කර ගැනීමේ අගය මත පදනම් වූ ප්‍රමාණයන්ගෙන් පවත්වාගෙන යනු ලබයි. ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස් උපකරණ, සාධාරණ අගය මත පදනම්ව හඳුනා ගනී.

5.4. ගනුදෙනුවකට, වෙනත් සිදුවීමකට හෝ තත්ත්වයකට විශේෂයෙන් ගිණුම්කරණ ප්‍රමිතයක් නොමැති අවස්ථාවක සමාන හා අදාළ ගැටළු සම්බන්ධයෙන් බලපවත්වන ගිණුම්කරන ප්‍රමිතයන්ගේ අවශ්‍යතා සලකා බලා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ දී සහ අනුගත කිරීමේ දී කළමනාකරණය සිය විනිශ්චය භාවිතා කළ යුතුය. ඒ අනුව, පහත කරුණු මෙම මූල්‍ය ප්‍රකාශන සමඟ එහි සඳහන් කර ඇති ප්‍රමිතයේ දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව ඉදිරිපත් කර ඇත.

5.4.1. අපේක්ෂිත ණය අලාභ සඳහා වෙන්කිරීම : ශ්‍රී ලං.ගි.ප්‍රමිත (LKAS) 26 ට අරමුදලෙහි මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම අවශ්‍ය නොවේ. කෙසේවෙතත්, මූල්‍ය උපකරණවල සාධාරණ තත්ත්වය පිළිබිඹු කිරීම සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන SLFRS 09 හි දක්වා ඇති මාර්ගෝපදේශ යටතේ ගණනය කර වෙන්කිරීම සිදු කර ඇත. ප්‍රති පාර්ශවය රටෙහි ස්වෛරී ආයතනය වන බැවින් සහ මූල්‍ය උපකරණ නිකුත් කර තිබෙන්නේ රුපියල් මත පදනම් වන බැවින්, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා හානිකරණය තක්සේරු නොකෙරේ.

5.4.2. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් පිළිබඳ සටහන් SLFRS 09 හි දක්වා ඇති මාර්ගෝපදේශ යටතේ දක්වා ඇත.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 6 පොලී ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023 | | | 2022 |
|---|---|---|---|---|
| | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොලිය | 378,441,273 | - | 378,441,273 | 325,422,599 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලිය | 60,402,705 | - | 60,402,705 | 15,272,142 |
| සාංගමික ණය සුරැකුම්පත් මත පොලිය - ලැයිස්තුගත | 1,686,725 | - | 1,686,725 | 2,290,667 |
| සාංගමික ණය සුරැකුම්පත් මත පොලිය - ලැයිස්තුගත නොකළ | 637,486 | - | 637,486 | 637,500 |
| ස්ථාවර තැන්පතු මත පොලිය | - | - | - | 4,225,390 |
| ප්‍රති විකුණුම් මත පොලිය | 1,251,137 | - | 1,251,137 | 1,420,892 |
| | **442,419,326** | **-** | **442,419,326** | **349,269,190** |

## 7 ලාභාංශ ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023 | | | 2022 |
|---|---|---|---|---|
| | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ස්කන්ධ සුරැකුම්පත් වලින් ලද ලාභාංශ | 2,997,302 | - | 2,997,302 | 7,527,818 |
| | **2,997,302** | **-** | **2,997,302** | **7,527,818** |

## 8 ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023 | | | 2022 |
|---|---|---|---|---|
| | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ලැයිස්තුගත ස්කන්ධ සුරැකුම්පත් | 23,835,878 | - | 23,835,878 | (40,995,584) |
| | **23,835,878** | **-** | **23,835,878** | **(40,995,584)** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 9 මූල්‍ය වත්කම් හානිකරණය (ඌණ සහ අධි වෙන්කිරීම්)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023 | 2022 |
|---|---|---|
| | රු.000 | රු.000 |
| ඌණ/(අධි) හානිකරණ සඳහා වෙන්කිරීම්, (සටහන් 16 සහ 18) | | |
| සාංගමික ණය සුරැකුම්පත් | (3,758) | 4,531 |
| ස්ථාවර තැන්පතු | - | (1,154) |
| බැංකු ශේෂය | (278) | 565 |
| | (4,036) | 3,941 |
| | | |
| ඌණ/(අධි) හානිකරණ සඳහා වෙන්කිරීම්/හානිකරණ වියදම් | (4,036) | 3,941 |

## 10 වෙනත් ආදායම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023 | | | 2022 |
|---|---|---|---|---|
| | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| අධිභාර | 237,017 | - | 237,017 | 255,408 |
| වෙනත් ආදායම් | 2,020 | 2,069 | 4,089 | 15,010 |
| | **239,037** | **2,069** | **241,106** | **270,418** |

## 11 මෙහෙයුම් වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023 | | | 2022 |
|---|---|---|---|---|
| | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| සේවක පිරිවැය | 934,614 | 459,799 | 1,394,413 | 1,464,458 |
| පරිපාලන පිරිවැය | 485,115 | 346,430 | 831,545 | 598,253 |
| වෙනත් වියදම් | 74,433 | 4,308 | 78,741 | 71,071 |
| | **1,494,162** | **810,537** | **2,304,699** | **2,133,782** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 12 බදු වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023<br>රු.000 | 2022<br>රු.000 |
|---|---|---|
| වර්ෂයේ ලාභය මත ගෙවිය යුතු ආදායම් බදු (12.1) | 61,939,424 | 49,825,806 |
| පෙර වර්ෂයන්ට අදාළ ප්‍රතිපාදන ඌණ/(අධි) වෙන් කිරීම් | 9,971 | 155,811 |
| | **61,949,395** | **49,981,617** |

ප්‍රවර්ථන කාල පරිච්ඡේදයේ බදු මත ලාභය වෙනුවෙන් ගෙවිය යුතු ඇස්තමේන්තුගත ආදායම් බදු මුදල සහ පෙර වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් බදු වියදමට කරන ලද ගැලපීම් වලින් බදු වියදම සමන්විත වේ. ප්‍රවර්තන වර්ෂයේ බදු වගකීම ගණනයට අදාළ වන නීතීන්, නියෝගයන්, නිර්නායකයන් මත ප්‍රවර්තන වර්ෂය සඳහා වන බදු වියදම ඇස්තමේන්තුගත කර තිබේ.

**අදාළ බදු නීති යටතේ යොදා ගනු ලබන වැදගත් ප්‍රතිපාදනවල සාරාංශය**

(අ) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව 2018 අප්‍රේල් මස පළමු වන දින සිට බලපැවැත්වෙන පරිදි 14% අනුපාතිකයකට යටත්ව ආදායම් බදු ගෙවිය යුතුය.

(ආ) 2022 ඔක්තෝබර් 1 සිට ලාභාංශ සඳහා අදාළ ආදායම් බදු අනුපාතය 15% වේ.

## 12.1 බදු පෙර ලාභය සහ බදු අයකළ හැකි ආදායම අතර සැසඳුම

| | | 2023<br>රු.000 | 2022<br>රු.000 |
|---|---|---|---|
| බදු පෙර මෙහෙයුම් ලාභ/(අලාභ) | | 467,192,949 | 313,934,119 |
| ගැලපුම්; | | | |
| ලාභාංශ ආදායම | | (2,997,302) | (888,087) |
| ලාභාංශ ආදායමක් ලෙස හඳුනාගත් කොටස් නැවත මිලදී ගැනිම | | 3,481 | 3,366 |
| ලාභාංශ ආදයම ලෙස සැලකෙන සංචිත ප්‍රාග්ධනීකරණය | | 18,116 | |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ (ලාභ) /අලාභ | | (23,835,878) | 40,995,584 |
| මූල්‍ය වත්කම් හානිකරණය සඳහා වූ ඌන/(අධි) වෙන් කිරීම් | | (4,036) | 3,941 |
| ඉඩදෙනු නොලබන වියදම් | | 2,045,582 | 1,837,255 |
| බදු සඳහා ගලපන ලද ආදායම | | 442,422,912 | 355,886,178 |
| | | | |
| අරමුදල සඳහා වර්තමාන බදු වියදම | | - | 905,659 |
| ලාභාංශ ආදායම (14% .2022.09.30 දක්වා) | @14% | 3,240 | 26,116 |
| ලාභාංශ ආදායම (15% 2022.10.01 න් පසු) | @15% | 61,936,184 | 48,894,031 |
| ඉතිරි ආදායම (14%) | @14% | 61,939,424 | 49,825,806 |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 13 දේපළ, පිරියත හා උපකරණ

### 13.1 සේ.අ.අ. දෙ.- ශ්‍රී ල.ම.බැ. සහ කම්කරු දෙපාර්තමේන්තුව - 2023

| | පරිගණක උපකරණ | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | කාර්යාලයීය උපකරණ | රථවාහන | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පිරිවැය | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට | 625,707 | 202,348 | 454,863 | 97,202 | 6,423 | 1,386,543 |
| වර්ෂය තුළ එකතුවීම් | 61,402 | - | 8,410 | - | - | 69,812 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **687,109** | **202,348** | **463,273** | **97,202** | **6,423** | **1,456,355** |
| සමුච්චිත ක්ෂය | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට | 535,486 | 112,579 | 314,019 | 56,093 | 5,869 | 1,024,046 |
| වාර්ෂික අය කිරීම් | 24,126 | 13,660 | 11,995 | - | 16 | 49,797 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **559,612** | **126,239** | **326,015** | **56,093** | **5,885** | **1,073,843** |
| ශුද්ධ පොත් අගය | | | | | | |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **127,497** | **76,109** | **137,259** | **41,109** | **538** | **382,512** |
| **2022 දෙසැම්බර් 31 දිනට** | **90,221** | **89,768** | **140,842** | **41,109** | **554** | **362,496** |

සේ.අ.අ. දෙ.- ශ්‍රී ල.ම.බැ. සහ කම්කරු දෙපාර්තමේන්තුව - 2022

| | පරිගණක උපකරණ | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | කාර්යාලයීය උපකරණ | රථවාහන | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පිරිවැය | | | | | | |
| 2022 ජනවාරි 01 දිනට | 610,210 | 112,190 | 432,741 | 97,202 | 6,423 | 1,258,766 |
| වර්ෂය තුළ එකතුවීම් | 15,665 | 90,157 | 22,122 | - | - | 127,944 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | (167) | - | - | - | - | (167) |
| **2022 දෙසැම්බර් 31 දිනට** | **625,707** | **202,347** | **454,863** | **97,202** | **6,423** | **1,386,543** |
| සමුච්චිත ක්ෂය | | | | | | |
| 2022 ජනවාරි 01 දිනට | 517,812 | 100,023 | 304,842 | 56,093 | 5,846 | 984,616 |
| වාර්ෂික අය කිරීම් | 17,740 | 12,556 | 9,177 | - | 24 | 39,497 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | (66) | - | - | - | - | (66) |
| **2022 දෙසැම්බර් 31 දිනට** | **535,486** | **112,579** | **314,020** | **56,093** | **5,869** | **1,024,047** |
| ශුද්ධ පොත් අගය | | | | | | |
| **2022 දෙසැම්බර් 31 දිනට** | **90,221** | **89,767** | **140,843** | **41,109** | **554** | **362,496** |
| **2021 දෙසැම්බර් 31 දිනට** | **92,398** | **12,167** | **127,898** | **41,109** | **578** | **274,150** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

දේපළ, පිරියත හා උපකරණ (සම්බන්ධවයි ....)

**13.2**

| 2023 | පරිගණක උපකරණ | | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | | කාර්යාලයීය උපකරණ | | රථවාහන | | වෙනත් | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | එකතුව |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පිරිවැය | | | | | | | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට | 140,645 | 485,062 | 76,281 | 126,067 | 30,922 | 423,941 | - | 97,202 | 6,071 | 352 | 253,919 | 1,132,624 | 1,386,543 |
| වර්ෂය තුළ එකතුවීම් | 46,905 | 14,497 | - | - | 1,499 | 6,911 | - | - | - | - | 48,404 | 21,408 | 69,812 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2023 දෙසැම්බර් 31 දිනට | **187,550** | **499,559** | **76,281** | **126,067** | **32,421** | **430,852** | **-** | **97,202** | **6,071** | **352** | **302,323** | **1,154,032** | **1,456,355** |
| සමුච්චිත ක්ෂය | | | | | | | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට | 126,876 | 408,610 | 46,313 | 66,266 | 26,138 | 287,881 | - | 56,094 | 5,517 | 352 | 204,844 | 819,203 | 1,024,047 |
| වාර්ෂික අය කිරීම් | 12,041 | 12,085 | 4,356 | 9,303 | 4,506 | 7,489 | - | - | 16 | - | 20,919 | 28,877 | 49,796 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2023 දෙසැම්බර් 31 දිනට | **138,917** | **420,695** | **50,669** | **75,569** | **30,644** | **295,370** | **-** | **56,094** | **5,533** | **352** | **225,763** | **848,080** | **1,073,843** |
| 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | **48,633** | **78,864** | **25,612** | **50,498** | **1,777** | **135,481** | **-** | **41,108** | **538** | **-** | **76,560** | **305,952** | **382,512** |
| 2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | | | | | | | | | | | | | |
| | **13,769** | **76,452** | **29,968** | **59,801** | **4,784** | **136,060** | **-** | **41,108** | **554** | **-** | **49,075** | **313,421** | **362,496** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

දේපළ, පිරියත හා උපකරණ (සම්බන්ධවයි ....)

**13.2**

| 2022 | පරිගණක උපකරණ | | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | | කාර්යාලයීය උපකරණ | | රථවාහන | | වෙනත් | | එකතුව | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | ශ්‍රී ල.ම.බැ. | කම්කරු දෙපාර්. | |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පිරිවැය | | | | | | | | | | | | | |
| 2022 ජනවාරි 01 දිනට | 140,203 | 470,006 | 47,966 | 64,226 | 29,783 | 402,958 | - | 97,202 | 6,071 | 352 | 224,024 | 1,034,744 | 1,258,768 |
| වර්ෂය තුළ එකතුවීම් | 609 | 15,056 | 28,315 | 61,841 | 1,139 | 20,983 | - | - | - | - | 30,063 | 97,880 | 127,944 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | (167) | - | - | - | - | - | - | - | - | - | (167) | - | (167) |
| **2022 දෙසැම්බර් 31 දිනට** | **140,645** | **485,062** | **76,281** | **126,067** | **30,922** | **423,941** | **-** | **97,202** | **6,071** | **352** | **253,919** | **1,132,624** | **1,386,543** |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | | | | | | |
බ්ලූම්බර්ග් හානි සංඛ්‍යා මගින් TTC PD පෙන්නුම් කරනු අතර, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාග මනය පදනම් පරිවර්තන ප්‍රවේශයට අනුකූලව සිදු කළ ආර්ථික සාධක ගැලපීම් යොදා ගනිමින්, එය (TTC PD ) නියමිත කොටසට නියමිත වේලාවට (PiT) පරිවර්තනය කරනු ලබයි.

**II ණය පැහැර හැරීමේ සම්භාවිතා ආකෘතියේ ආයු කාලය**

බ්ලූම්බර්ග් ණය පැහැර හැරීමේ සම්භාවිතාවය මගින් සැලකිය යුතු ලෙස පිරිහී ඇති ආයෝජන වල මාස 12 ක අපේක්ෂිත ණය අලාභය ඉදිරිපත් කරයි. මාස 12 ක ණය පැහැර හැරීමේ සම්භාවිතාවය භාවිතා කරමින් තක්සේරු කළ ණය පැහැර හැරීමේ සම්භාවිතාවේ වක්‍රය මත පදනම්ව සේවක අර්ථසාධක අරමුදල ණය පැහැර හැරීමේ සම්භාවිතා ආයුකාලය සලකා බලයි.

**III ණය පැහැර හැරීම් අවදානමේ සැලකිය යුතු ඉහළ යාම (SICR) නිර්ණය කිරීම**

සේවක අර්ථසාධක අරමුදල විසින් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් ප්‍රකාශයට පත් කරන ලද පොදුවේ පිළිගත් ආයෝජන හා ආයෝජන නොවන ශ්‍රේණි නිර්වචන මත පදනම්ව ණය ගෙවීම් පැහැර හැරීම පිළිබඳ අවධානම සැලකිය යුතු ලෙස තීරණය කරයි. සාමාන්‍යයෙන් "BBB - " වලට පහළින් වූ ශ්‍රේණිගත කිරීම් ආයෝජන නොවන ශ්‍රේණියේ ආයෝජන ලෙස සලකයි. මේ අනුව, සේවක අර්ථසාධක අරමුදල විසින් මෙවැනි ආයෝජන, ණය පැහැර හැරීමේ අවධානමේ සැලකිය යුතු පිරිහීමක් සිදු වීමක් ලෙස සලකයි. මෙවැනි ආයෝජන සඳහා සේවක අර්ථසාධක අරමුදල විසින් එහි ආයු කාලයටම අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සිදු කරයි.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**29** හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

ගෝලීය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් සාමාන්‍යයෙන් පිළිගත් ශ්‍රේණිගත කිරීම් විශ්ලේෂණය කිරීම පහත පරිදි වේ.

| ICRA ණය ශ්‍රේණිගත කිරීම් | ෆිට්ච් ණය ශ්‍රේණිගත කිරීම් | මූඩිස් ණය ශ්‍රේණිගත කිරීම් | බ්ලූම්බර්ග් අවුරුද්දක ණය ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රමාණය | ණය පැහැර හැරීම පිළිබඳ සම්භාවිතාව ඉහළ සීමාව | |
| AAA | AAA | Aaa | IG-1 | 0.00% | මාස 12 (ආයෝජන ශ්‍රේණි) |
| AA+ | AA+ | Aa1 | IG-2 | 0.00% | |
| AA | AA | Aa2 | IG-3 | 0.01% | |
| AA- | AA- | Aa3 | IG-4 | 0.02% | |
| A+ | A+ | A1 | IG-5 | 0.03% | |
| A | A | A2 | IG-6 | 0.05% | |
| A- | A- | A3 | IG-7 | 0.10% | |
| BBB+ | BBB+ | Baa1 | IG-8 | 0.17% | |
| BBB | BBB | Baa2 | IG-9 | 0.30% | |
| BBB- | BBB- | Baa3 | IG-10 | 0.52% | |
| BB+ | BB+ | Ba1 | HY-1 | 0.88% | ජීවිතකාලය 1 (ආයෝජන නොවන ශ්‍රේණි) |
| BB | BB | Ba2 | HY-2 | 1.50% | |
| BB- | BB- | Ba3 | HY-3 | 2.40% | |
| B+ | B+ | B1 | HY-4 | 4.00% | |
| B | B | B2 | HY-5 | 6.00% | |
| B- | B- | B3 | HY-6 | 10.00% | |
| | CCC | Caa1 | DS-1 | 15.00% | |
| | CCC | Caa2 | DS-2 | 22.00% | |
| | CCC | Caa3 | DS-3 | 30.00% | |
| | CCC | Ca | DS-4 | 50.00% | |
| | DDD | C | DS-5 | 100.00% | |
| | D | / | DDD | පැහැර හැරීම් | |

තවද, ණය පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක් වූ විට මූල්‍ය උපකරණයන්හි ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බව සේවක අර්ථසාධක අරමුද, සලකයි. ආයෝජන ශ්‍රේණියේ සිට ආයෝජන නොවන ශ්‍රේණිය දක්වා සියලුම ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම් ණය පැහැර හැරීම් අවධානමේ සැලකිය යුතු ඉහල යාමක් නියෝජනය කරන බව තහවුරු කර ගැනීමෙන් පසු, එක් එක් ආයෝජන ශ්‍රේණිගත කිරීම්වලින් කොපමණ ප්‍රමාණයක් පහත වැටුණද යන්න තීරණය කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුද, විසින් එහි සංක්‍රමණ රීතිය පහතින් වගුගත කර ඇත. එය ජීවිත කාලය සඳහා අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම සඳහා යොදා ගත හැකිය.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**29** **හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)**

පහත වගුවේ දැක්වෙන්නේ සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන සඳහා ණය පැහැර හැරීම් අවදානමේ සැළකිය යුතු ඉහළ යාමට අදාල විස්තීර්ණ තක්සේරුවකි.

| මුල් ශ්‍රේණිගත කිරීම් | SICR සිදු වූ බව සලකන පහත ශ්‍රේණිගත කිරීම | සටහන් චලනය | තාර්කිකත්වය |
|---|---|---|---|
| AAA to BBB- | BB+ | N/A | AAA සිට BBB-, BB+ දක්වා ඕනෑම ණය ශ්‍රේණිගත කිරීමතකින් ණය පැහැර හැරීමේ සම්භාවිතාවය අවම වශයෙන් දෙගුණයක් වේ. |
| AAA | AA | 2 | ණය පැහැරහැරීමේ සම්භාවිතාවය දෙගුණ වේ. |
| AA+ | AA- | 2 | ණය පැහැරහැරීමේ සම්භාවිතාවය දෙගුණ වේ. |
| AA | A+ | 2 | ණය පැහැරහැරීමේ සම්භාවිතාවය දෙගුණ වේ. |
| AA- | A | 2 | ණය පැහැරහැරීමේ සම්භාවිතාවය දෙගුණ වේ. |
| A+ | A- | 2 | ණය පැහැරහැරීමේ සම්භාවිතාවය දෙගුණ වේ. |
| A | BBB+ | 2 | ණය පැහැරහැරීමේ සම්භාවිතාවය දෙගුණ වේ. |
| A- | BBB | 2 | ණය පැහැරහැරීමේ සම්භාවිතාවය දෙගුණ වේ. |
| BBB+ | BBB- | 2 | ණය පැහැරහැරීමේ සම්භාවිතාවය දෙගුණ වේ. |

පවතින නවතම/ අදාළ ණය පැහැර හැරීමේ සම්භාවිතාවය සහ සංක්‍රාන්ති න්‍යාසය මත පදනම්ව සංක්‍රමණ රීති වගුව කලානුරූපීව නැවත තක්සේරු කර යාවත්කාලීන කරනු ලැබේ.

**IV** **පාඩු ලබා දී ඇති පැහැර හැරීම (LGD)**

(LGD) අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීම සඳහා, 2018 දෙසැම්බර් 31 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද SLFRS 09 සම්මත කර ගැනීම පිළිබඳ උපදේශන පත්‍රයට අනුකූලව පහත දැක්වෙන LGD/අලාභ අනුපාත සේවක අර්ථසාධක අරමුදල විසින් සලකා බලයි.

a. දේශීය මුදල් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ප්‍රතිවිකුණුම් 0%
b. අනෙකුත් සියලුම දේශීය මුදල් මූල්‍ය උපකරණ 45%

**V** අපේක්ෂිත ආර්ථික අලාභ නිර්ණය කිරීම සඳහා සේ.අ.අ. පෙර නිමි ලක්ෂයය ලෙස වසර මැද එනම් මාස 06 ක් යොදා ගන්නා අතර, එහිදී පෙරනිමි සිද්ධීන් වර්ෂයේ ප්‍රථම භාගයේ දී හෝ අවසාන භාගයේ දී උත්පාදනය වේ යැයි සලකා බලයි.

**VI** ආර්ථික සාධක ගැලපුම ගණනය කරනු ලැබුවේ අතීතයේ සිට පුරෝකථනය කරන ලද සහ 2012 සිට 2026 දක්වා පුරෝකථනය කරන ලද දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දළ දේශිය නිෂ්පාදිතයේ වර්ධන අනුපාත සංඛ්‍යා ලේඛන වලින් ලබා ගැනීමෙනි.

**VII** **මූල්‍ය ආයෝජන**

සේ.අ.අ., ශ්‍රී ලංකා මහ බැංකුවේ එකම බලසීමාවක් තුළ බැවින්, ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් ආයෝජනය සඳහා ශ්‍රී ලංකා ස්වෛරී ශ්‍රේණිගත කිරීම් භාවිතා කරනු නොලබයි. ණය අවදානමේ සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් නොකරන අතර, එම නිසා සේ.අ.අ. මාස 12 සඳහා අපේක්ෂිත ණය අලාභ සැලකීමේ දී හොඳම අවස්ථාව ලබාග නී.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

29.1 ආදායම් ප්‍රකාශයේ සටහන් කර ඇති වර්ෂය සඳහා මූල්‍ය උපකරණ මත අපේක්ෂිත ණය අලාභ ගාස්තු පහත වගු වලින් දැක්වේ.

2023.12.31

| රු.000 | | මට්ටම 1 (12MECL) | | මට්ටම 2 (LTECL) | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | සටහන | තනි | සාමූහික | තනි | සාමූහික | |
| බැංකු මුදල් | **8** | (278) | - | - | - | (278) |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් | **8** | (3,758) | - | - | - | (3,758) |
| **මුළු හානිකරණ අලාභ** | | **(4,036)** | **-** | **-** | **-** | **(4,036)** |

| 2023.12.31<br>රු.000 | සුවිශේෂී | සාමූහික (තනි තනිව සැලකිය යුතු නොවූ නිරාවරණ) | සාමූහික සිදුව ඇති නමුත් තවමත් හඳුනාගෙන නොමැති) | එකතුව |
|---|---|---|---|---|
| බැංකු ශේෂ සඳහා ණය අලාභ වියදම් | (278) | - | - | (278) |
| | (278) | - | | (278) |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | (3,758) | - | - | (3,758) |
| | (3,758) | - | - | (3,758) |
| ශේෂ පත්‍ර අයිතම එකතුව | (4,036) | - | - | (4,036) |
| කපාහල ශේෂ පත්‍ර අයිතම | - | - | - | - |
| **එකතුව** | (4,036) | - | - | (4,036) |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)**

**ස්ථාවර ආදායම් සුරැකුම්පත**

LKAS අනුව, බාහිර ණය ශ්‍රේණිගත කිරීම් මත ණය ගුණාත්මකභාවය සහ ණය අවදානමට උපරිම නිරාවරණය වීම පහත වගුවේ දැක්වේ. ඉදිරිපත් කර ඇති සංඛ්‍යා දළ හානිකරණ දීමනා වේ. අරමුදලේ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ක්‍රමය සටහන් 29 විස්තර කර ඇති අතර අපේක්ෂිත ණය අලාභ තනි තනිව හෝ සාමූහිකව ගණනය කරන්නේ ද යන්න පිළිබඳ ප්‍රතිපත්ති සටහන් 29 හි දක්වා ඇත.

| 2023.12.31 | 12 MECL | | LTECL | | | |
|---|---|---|---|---|---|---|
| | සාමූහික | | සාමූහික | | එකතුව | |
| | වටිනාකම | ECL | වටිනාකම | ECL | වටිනාකම | ECL |
| **රු.000** | | | | | | |
| බාහිර ණය ශ්‍රේණිය | | | | | | |
| AAA | 3,748,028,268 | - | | | 3,748,028,268 | - |
| AA+ | | | | | - | - |
| AA | | | | | - | - |
| AA- | | | | | - | - |
| A+ | | | | | - | - |
| A | 6,090,994 | 444 | 10,619,377 | 1,836 | 16,710,371 | 2,279 |
| A- | 106,282 | 14 | 2,334,887 | 495 | 2,441,169 | 509 |
| BBB+ | | | | | - | - |
| BBB | | | | | - | - |
| BBB- | | | | | - | - |
| BB+ | | | | | - | - |
| **එකතුව** | **3,754,225,545** | **458** | **12,954,264** | **2,331** | **3,767,179,809** | **2,789** |

| 2022.01.01 | 12 MECL | | LTECL | | | |
|---|---|---|---|---|---|---|
| | සාමූහික | | සාමූහික | | එකතුව | |
| | වටිනාකම | ECL | වටිනාකම | ECL | වටිනාකම | ECL |
| **රු.000** | | | | | | |
| බාහිර ණය ශ්‍රේණිය | | | | | | |
| AAA | 3,361,993,342 | - | - | - | 3,361,993,342 | - |
| AA+ | - | - | - | - | - | - |
| AA | - | - | - | - | - | - |
| AA- | - | - | - | - | - | - |
| A+ | - | - | - | - | - | - |
| A | 9,577,643 | 1,384 | 10,628,574 | 3,027 | 20,206,216 | 4,411 |
| A- | 6,029,475 | 1,569 | 1,712,854 | 845 | 7,742,330 | 2,414 |
| BBB+ | - | - | - | - | - | - |
| BBB | - | - | - | - | - | - |
| BBB- | - | - | - | - | - | - |
| BB+ | - | - | - | - | - | - |
| **එකතුව** | **3,377,600,460** | **2,953** | **12,341,428** | **3,872** | **3,389,941,888** | **6,825** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

**29.2** ණය ගුණාත්මකභාවය විශ්ලේෂණය

බාහිර ණය ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය අනුව, SLFRS 09 යටතේ විශ්ලේෂණය කරන ලද 2022.12.31 දිනට දළ ශේෂයන් පහත වගුවේ දැක්වෙන අතර, එය සටහන 29 හි විස්තර කර ඇත.

| 2023.12.31 | අතීතයේ ගෙවීමට නියමිත නොවූ හෝ හානිකරණය නොවූ | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රු.000 | **AAA** | **AA+** | **AA** | **AA-** | **A+** | **A** | **A-** | **BBB+** | **BBB** | **BBB-** | **BB+** | **Total** |
| ආයෝජන වටිනාකම් | | | | | | | | | | | | |
| *ස්ථාවර ආදායම් සුරකුම්පත්* | | | | | | | | | | | | |
| සාංගමික ණය සුරකුම්පත් | - | - | - | - | - | 11,736,289 | 2,334,887 | - | - | - | - | 14,071,177 |
| බැංකු ශේෂය | - | - | - | - | - | 4,974,082 | 106,282 | - | - | - | - | 5,080,364 |
| | **-** | **-** | **-** | **-** | **-** | **16,710,371** | **2,441,169** | **-** | **-** | **-** | **-** | **19,151,541** |
| ECL වෙන්කිරීම් | | | | | | | | | | | | |
| ස්ථාවර ආදායම් සුරකුම්පත් | | | | | | | | | | | | |
| සාංගමික ණය සුරකුම්පත් | - | - | - | - | - | 1,913 | 495 | - | - | - | - | 2,408 |
| බැංකු ශේෂය | - | - | - | - | - | 367 | 14 | - | - | - | - | 381 |
| **එකතුව** | **-** | **-** | **-** | **-** | **-** | **2,279** | **509** | **-** | **-** | **-** | **-** | **2,789** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

| 2023.01.01 | අතීතයේ ගෙවීමට නියමිත නොවූ හෝ හානිකරණය නොවූ | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රු.000 | AAA | AA+ | AA | AA- | A+ | A | A- | BBB+ | BBB | BBB- | BB+ | Total |
| ආයෝජන වටිනාකම් | | | | | | | | | | | | |
| *ස්ථාවර ආදායම් සුරැකුම්පත්* | | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | - | - | - | - | - | 15,964,894 | 7,652,225 | - | - | - | - | 23,617,119 |
| බැංකු ශේෂය | - | - | - | - | - | 4,241,323 | 90,104 | - | - | - | - | 4,331,427 |
| බැංකු ශේෂය | - | - | - | - | - | 20,206,217 | 7,742,330 | - | - | - | - | 27,948,546 |
| | | | | | - | | | | | | | |
| ECL වෙන්කිරීම් | | | | | | | | | | | | |
| *ස්ථාවර ආදායම් සුරැකුම්පත්* | | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | - | - | - | - | - | 3,776 | 2,389 | - | - | - | - | 6,165 |
| බැංකු ශේෂය | - | - | - | - | - | 634 | 25 | - | - | - | - | 659 |
| **එකතුව** | - | - | - | - | - | 4,410 | 2,414 | - | - | - | - | 6,825 |

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**30** ලැයිස්තුගත නොකළ කොටස් උපකරණ තක්සේරුකරණය

ලැයිස්තුගත නොකළ කොටස් උපකරණ වල ඇස්තමේන්තුගත සාධාරණ අගය පහත පරිදි වේ.

| ආයෝජන | පදනම | කොටස් ගණන | මිලදී ගැණුම් පිරිවැය | 2023 | | 2022 | |
|---|---|---|---|---|---|---|---|
| | | | | කොටසක සාධාරණ අගය | සාධාරණ අගය | කොටසක සාධාරණ අගය | සාධාරණ අගය |
| | | | රු.000 | රු. | රු.000 | රු. | රු.000 |
| කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 500,000,000 | 5,000,000 | 13.07 | 6,536,935 | 10.80 | 5,400,000 |
| කාර්ගිල්ස් බැංකුව * | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 44,000,000 | 495,000 | 11.01 | 484,286 | 10.56 | 464,640 |
| වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගම | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 29,750,000 | 2,975,000 | 826.82 | 24,597,903 | 732.02 | 21,777,595 |
| ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 62,500 | 625 | 62.75 | 3,922 | 48.38 | 3,024 |
| ලාෆ් ගෑස් ඉකෝ ශ්‍රී ලිමිටඩ් (ඡන්ද) | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 57,897,800 | 62,282 | 3.02 | 174,619 | 3.27 | 189,326 |
| ලාෆ් ගෑස් ඉකෝ ශ්‍රී ලිමිටඩ් (නිඡ්ඡන්ද) | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 18,041,300 | 19,407 | 3.02 | 54,412 | 3.27 | 58,995 |
| ලාෆ් ගෑස් ලෙෂර් ලිමිටඩ් (ඡන්ද) | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 57,897,800 | 448,820 | 5.54 | 320,839 | 4.76 | 275,594 |
| ලාෆ් ගෑස් ලෙෂර් ලිමිටඩ් (නිඡ්ඡන්ද) | ශුද්ධ වත්කම් පදනම් කරගෙන | 18,041,300 | 139,855 | 5.54 | 99,975 | 4.76 | 85,877 |
| මුළු එකතුව | | | **9,140,989** | | **32,272,891** | | **28,255,050** |

ලබාගත හැකි තොරතුරු සීමිත බැවින්, ෆිච් රේටින්ග්ස් ශ්‍රේණිගත කිරීම හැර සෙසු ලැයිස්තුගත නොකළ කොටස් උපකරණවල සාධාරණ අගය තක්සේරු කිරීමට ශුද්ධ වත්කම් ආකෘතිය භාවිතා කරන ලදී.

*කාර්ගිල්ස් බැංකුව 2024.01.09 දින කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති අතර, 2024.01.31 දින වනවිට රු.7.90 ට ගනුදෙනු විය. ඒ අනුව, 2023.01.31 දිනට සේ.අ.අ. හිමිකාරීත්වයේ වෙළෙඳපළ වටිනාකම රු.347,600,000.00 කි.

මූල්‍ය ප්‍රකාශන බලපෑම සමස්තයක් ලෙස

| | 2022 | 2023 |
|---|---|---|
| පිරිවැය | 9,140,989 | 9,140,989 |
| ඇස්තමේන්තුගත සාධාරණ අගය | 28,255,050 | 32,272,891 |
| ශුද්ධ වත්කම්වලට ඇති බලපෑම | 19,114,061 | 23,131,902 |
| සාධාරණ අගයන් වෙනස් වීම මත FVOCI වෙත වූ දළ බලපෑම | | 4,017,842 |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**31.** කළඹේ කල්පිරීමේ ව්‍යූහය පිළිබඳ වර්ගීකරණය

2022 දෙසැම්බර් 31 දිනට

(රු.මිලි.)

| ආයෝජන පංතිය | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | 2031 | 2032 | 2033 | 2034 | 2035 | 2036 | 2037 | 2038 | 2039 | 2041 | 2044 | 2045 | Not Defined | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් | | | | | | | | | | | | | | | | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | | 92,434 | 235,366 | 277,827 | 212,751 | 210,373 | 216,894 | 216,786 | 414,673 | 322,299 | 318,465 | 209,831 | 216,454 | 216,432 | 14,084 | 29,254 | 92,512 | 5,474 | - | 3,301,911 |
| සාංගමික ණයකර | 1,117 | 7,834 | 4,094 | - | 1,025 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 14,071 |
| භාණ්ඩාගාර බිල්පත් | 420,297 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 420,297 |
| ප්‍රතිමිලදී ගැණුම් | 25,820 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 25,820 |
| වෙනත් ආයෝජන | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කොටස් උපකරණ | | | | | | | | | | | | | | | | | | | | | |
| - ලැයිස්තුගත කොටස් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 96,376 | 96,376 |
| - ලැයිස්තුගත නොකළ කොටස් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 9,141 | 9,141 |
| මුළු එකතුව | 447,234 | 7,834 | 96,529 | 235,366 | 278,853 | 212,751 | 210,373 | 216,894 | 216,786 | 414,673 | 322,299 | 318,465 | 209,831 | 216,454 | 216,432 | 14,084 | 29,254 | 92,512 | 5,474 | 105,517 | 3,867,617 |

| | |
|---|---|
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය සුරැකුම්පත් හානි කිරීම සඳහා ප්‍රතිපාදන | (2) |
| කළඹ වටිනාකම - හානිකරණය සඳහා ගැළපීම් සිදු කිරීමෙන් පසු | 3,867,614 |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

32. සංසන්දනාත්මක තොරතුරු

සේ.අ.අ. සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය කර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන SLFRS 09 - මූල්‍ය උපකරණ සහ SLFRS 07 - මූල්‍ය උපකරණ : හෙළිදරව් කිරීම් යන ගිණුම්කරණ ප්‍රමිතීන් යටතේ ඉදිරිපත් කරන ලදී. එබැවින්, සටහන් 05 හි සඳහන් පරිදි සේ.අ.අ. හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 26 යටතේ වාර්තාගත මූල්‍ය ආයෝජන ලෙස වෙනස් කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස සේ.අ.අ. හි මූල්‍ය වත්කම් වර්ගීකරණය ද වෙනස් වී ඇත. කෙසේ වෙතත්, ආදායම් සහ වියදම් ප්‍රකාශනයේ බලපෑම ප්‍රමාණාත්මක නොවන බැවින් සහ පෙර වර්ෂයේ මූල්‍ය තත්ත්වය වෙනස් වී නොමැති බැවින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කර නොමැත.

SLFRS 09 අනුව මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය (FVTPL) හා වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය (FVOCI) ලෙස කාණ්ඩ 03 කට වර්ගීකරණය කර ඇති අතර, LKAS 26 යටතේ වර්ගීකරණය කර ඇත්තේ නිදහස් කර ගැනීමේ අගය මත පදනම් වූ ප්‍රමාණයන්ගෙන් අගය කරන ලද මූල්‍ය වත්කම් (ක්‍රමක්ෂය කළ පිරිවැයට සමාන) සහ සාධාරණ අගය මත පදනම් වූ මූල්‍ය වත්කම් ලෙස කාණ්ඩ 02 කට පමණි. පෙර සේ.අ.අ. විසින් සියලුම ස්ථාවර ආදායම් සුරැකුම්පත් ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ගීකරණය කර ඇති අතර, LKAS 26 ට අනුව එම සුරැකුම්පත් නිදහස් කර ගැනීමේ අගය මත පදනම් වූ ප්‍රමාණයන්ගෙන් අගය කරන ලද මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. SLFRS 09 ට අනුව FVTPL යටතේ වර්ග කර ඇති ලැයිස්තුගත කොටස් සහ FVOCI යටතේ වර්ග කර ඇති ලැයිස්තුගත නොකළ කොටස් LKAS 26 අනුව සාධාරණ වටිනාකම මත පදනම් වූ මූල්‍ය වත්කම් ලෙස නැවත වර්ගීකරණය කර ඇත.

ලැයිස්තුගත නොකළ කොටස්වල වර්ගීකරණ වෙනස හේතුවෙන්, සාධාරණ අගය මත පදනම් වූ මූල්‍ය උපකරණවල ශුද්ධ ලාභය/ (අලාභය) තුළ ලැයිස්තුගත කර ඇති සහ ලැයිස්තුගත නොකළ කොටස් ආයෝජන දෙකෙහිම වෙළෙඳපොළ තක්සේරු කිරීම් මත ලාභය / (අලාභය) ඇතුළත් වේ. LKAS 26 යටතේ වෙනත් විස්තීර්ණ ආදායම් සංරචකයක් නොමැති අතර, අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය 2023 සිට සේ.අ.අ. හි මූල්‍ය ප්‍රකාශනවල කොටසක් නොවේ. තවද, ආයෝජන ප්‍රති තක්සේරු කිරීමේ සංචිතයේ ඉතිරිය රඳවාගත් ඉපැයුම් වෙත මාරු කරනු ලැබේ.

පහත දැක්වෙන සංසන්දනාත්මක සංඛ්‍යාන වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලට අනුකූල වන පරිදි නැවත වර්ගීකරණය කර ඇත.

**32.1 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශනය සැසඳුම**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 | | | 2022 |
|---|---|---|---|---|
| | සැසඳුමට අදාළ සටහන් රු.000 | (වාර්තා කළ) රු.000 | ප්‍රතිපත්ති වෙනස්වීමේ බලපෑම රු.000 | (සංසන්දනාත්මක තොරතුරු) රු.000 |
| පොලී ආදායම් | | 349,269,190 | - | 349,269,190 |
| ලාභාංශ ආදායම් | | 7,527,818 | - | 7,527,818 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය සාධනපත්‍ර මත ශුද්ධ ලාභය/(අලාභය) | A | (40,878,068) | (117,517) | (40,995,584) |
| මූල්‍ය වත්කම් හානිකරණය සඳහා වෙන්කිරීම් (වැඩි/අඩු) | | (3,941) | - | (3,941) |
| **ආයෝජන ආදායම්** | | 315,914,999 | (117,517) | 315,797,483 |
| වෙනත් ආදායම් | | 270,418 | - | 270,418 |
| **දළ ආදායම** | | 316,185,417 | (117,517) | 316,067,901 |
| මෙහෙයුම් වියදම් | | (2,133,782) | - | (2,133,782) |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ලාභ/ (අලාභ)** | | 314,051,635 | (117,517) | 313,934,119 |
| ආදායම් බදු වියදම් | | (49,981,617) | - | (49,981,617) |
| **වර්ෂයේ මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 264,070,018 | (117,517) | 263,952,502 |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

32.1 සංසන්දනාත්මක තොරතුරු (සම්බන්ධවයි...)

32.2 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සැසඳුම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සැසඳුමට අදාළ සටහන් රු.000 | 2022 (වාර්තා කළ) රු.000 | ප්‍රතිපත්ති වෙනස්වීමේ බලපෑම රු.000 | 2022 (සංසන්දනාත්මක තොරතුරු) රු.000 |
|---|---|---|---|---|
| **වෙනත් විස්තීර්ණ ආදායම්**<br>වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම මත ශුද්ධ ලාභය/(අලාභය) | | (117,517) | 117,517 | - |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම** | A | **263,952,501** | **117,517** | **-** |

* මින් අනතුරුව, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක් නොවේ.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

32.1 සංසන්දනාත්මක තොරතුරු (සම්බන්ධවයි...)

**32.3** 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සැසඳුම

| දෙසැම්බර් 31 දිනට | සැසඳුමට අදාළ සටහන් රු.000 | 2022 (වාර්තා කළ) රු.000 | ප්‍රතිපත්ති වෙනස්වීමේ බලපෑම රු.000 | 2022 (සංසන්දනාත්මක තොරතුරු) රු.000 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| දේපල පිරියත හා උපකරණ | | 362,496 | - | 362,496 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | | 297,885 | - | 297,885 |
| අස්පෘශ්‍ය වත්කම් | | 3,537 | - | 3,537 |
| වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ සාධන පත්‍ර | | 9,784,750 | (9,784,750) | - |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ සාධන පත්‍ර | B | 71,156,128 | (71,156,128) | - |
| ක්‍රමක්ෂය පිරිවැයට ණය සාධන පත්‍ර | | 3,385,604,295 | (3,385,604,295) | - |
| කොටස් සුරැකුම්පත් | | - | 80,940,878 | 80,940,878 |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් | | - | 3,385,604,295 | 3,385,604,295 |
| තොගය | | 25,020 | - | 25,020 |
| ලැබිය යුතු පොලී | | 122,125 | - | 122,125 |
| ලැබිය යුතු දායක මුදල් | | 16,000,000 | - | 16,000,000 |
| වෙනත් ජංගම වත්කම් | | 4,080,828 | - | 4,080,828 |
| මුදල් හා මුදල් සමාන දෑ | | 4,330,788 | - | 4,330,788 |
| | | 3,491,767,852 | - | 3,491,767,852 |
| **වගකීම්** | | | | |
| ගෙවිය යුතු ගිණුම් | | 4,734 | - | 4,734 |
| උපචිත වියදම් | | 684,900 | - | 684,900 |
| වෙනත් ජංගම වගකීම් | | 31,216,978 | - | 31,216,978 |
| මුළු ශුද්ධ වත්කම් | | 31,906,612 | - | 31,906,612 |
| නියෝජනය කරනු ලබන්නේ | | 3,459,861,240 | - | 3,459,861,240 |
| සාමාජික ශේෂ | | | | |
| | | 3,380,616,835 | - | 3,380,616,835 |
| | | 3,380,616,835 | - | 3,380,616,835 |
| සංචිත | C | 74,581,858 | (274,858) | 74,307,000 |
| රඳවාගත් ලාභ | D | 4,662,547 | 274,858 | 4,937,405 |
| | | 79,244,405 | - | 79,244,405 |
| අරමුදලේ මුළු ශුද්ධ වටිනාකම | | 3,459,861,240 | - | 3,459,861,240 |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**සංසන්දනාත්මක තොරතුරු (සම්බන්ධවයි...)**

සටහන A

**ලාභ හෝ ආලභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය සාධන පත්‍ර මත ශුද්ධ ලාභය /(අලාභය)**

LKAS 26 යටතේ වෙනත් විස්තීර්ණ ආදායම් අදාළ නොවන බැවින් වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට (FVOCI) ඇති ලැයිස්තුගත ස්කන්ධ සාධන පත්‍ර සඳහා වාර්තා කර ඇති ශුද්ධ ලාභය/(අලාභය) ආදායම් සහ වියදම් ප්‍රකාශනය වෙත මාරු කරනු ලැබේ.

සටහන B

**මූල්‍ය ආයෝජන**

නව වත්කම් වර්ගීකරණය අනුව මූල්‍ය වත්කම්වල ආයෝජනය වෙනස් වේ. ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස් උපකරණ, සාධාරණ අගය මත මූල්‍ය උපකරණ යටතේ වර්ගීකරණය කර ඇත.

සටහන C

**ආයෝජන ප්‍රත්‍යාගණන සංචිත**

| | |
|---|---|
| 2022.12.31 දිනට ශේෂය | 274,858 |
| රඳවාගත් ඉපයීම් වෙත මාරු කිරීම් | (274,858) |
| 2023 සඳහන් සංසන්දනාත්මක අගය | - |

සටහන D

රඳවාගත් ඉපයුම්

| | |
|---|---|
| 2022.12.31 දිනට ශේෂය | 4,662,547 |
| ආයෝජන ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම් | 274,858 |
| 2023 සඳහන් සංසන්දනාත්මක අගය | 4,937,405 |

33 **කැපවීම්**

අරමුදල විසින් 2023.12.28 දින රු.34,333,812,380 වටිනා භාණ්ඩාගාර බැඳුම්කර මිලදීගෙන ඇති අතර, 2024.01.01 දින පියවීමට නියමිතය.

‘ඈ’ කොටස

# විගණකාධිපති වාර්තාව



මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/සී/ඊපීඑෆ්/1/2023/13 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 සැප්තැම්බර් 11 දින

කම්කරු කොමසාරිස් ජනරාල්,

කම්කරු දෙපාර්තමේන්තුව

අධිකාරී,

සේවක අර්ථසාධක අරමුදල

**සේවක අර්ථසාධක අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සේවක අර්ථසාධක අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, සාමාජිකයන්ගේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර ඇති කරුණු වලින් වන බලපෑම හැර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සාමාජික ගිණුම් ශේෂය තුල නිරූපිත උප ගිණුම් 5ක ශේෂයන්හි එකතුව රු.මිලියන 94,633ක් වුවද, එම ගිණුම්වලට අදාලව ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.මිලියන 78,693 ක් වුයෙන් ශේෂයන් අතර රු.මිලියන 15,940ක වෙනසක් නිරීක්ෂණයක් වූ නමුත් ඒ සඳහා සැසඳුම් ප්‍රකශන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 09කට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව 2001 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාලව මුදල් පොතේ සටහන් වූ නමුත් බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, බැංකු ප්‍රකාශයේ සටහන්වූ නමුත් මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, අගරු වූ චෙක්පත්, සෘජු හර/බැර, පරිගණක ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් ලෙස 2006 වර්ෂයේ සිට පවතින ශේෂය, තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් සහ චෙක්පත් හා නිකුත්කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස ගැලපුම් කල පසු ශුද්ධ ශේෂයන්හි එකතුව රු.මිලියන 4,757.69 ක් නිරවුල් නොකරන ලද ශේෂ ලෙස පැවතුණි. ඉන් රු.මිලියන 1,336.98 ක ශුද්ධ ශේෂයක් 2024 අප්‍රේල් 30 වන විටත් නිරවුල් කර නොතිබුණි. මෙම නිරවුල් නොකරණ ලද ශුද්ධ ශේෂය තුල ඇතුලත් රු.මිලියන 273.72 ක් මුදල් පොතෙහි නිරවුල් නොකල රු.මිලියන 5,175.11 ක ගනුදෙනු හා බැංකු ප්‍රකාශනයෙහි නිරවුල් නොකල රු.මිලියන 5,448.83 ක ගනුදෙනු එකිනෙකට හිලව් කර දක්වා තිබූ අගයක් වූ අතර එම ශේෂයන් 2018 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයන් වේ.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 1,154.03ක් වූ ස්ථාවර වත්කම් පැවතියද, එම ස්ථාවර වත්කම්වල කේත අංකය, මිලදී ගත් දිනය, ස්ථාවර වත්කම් පිරිවැය සහ වත්කම් ස්ථාපිත කර ඇති ස්ථානය ආදී මූලික තොරතුරු ඇතුලත් ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ක්ෂය ගණනය කිරීමේ උප ලේඛනය අනුව, සම්පූර්ණයෙන් ක්ෂය අවසන් කර තිබූ ස්ථාවර වත්කම්වල වටිනාකම කම්කරු දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයට අදාලව පිළිවෙලින් රු.මිලියන 644.89ක් හා රු.මිලියන 167.01ක් විය. එම වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය සමාලෝචනය නොකිරීමෙන් සිදු වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට ගනු නොලබන වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ පිරිවැය රු.මිලියන 97.20ක් ද, සමුච්චිත ක්ෂයවීම් රු.මිලියන 56.09ක් ද, ශුද්ධ අගය රු.මිලියන 41.11ක් ද විය. මෙම ශේෂයන් 2018 වර්ෂයේ සිට නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශනවල පවතින බැවින් 2018 වර්ෂයේ සිට රු.මිලියන 41.11ක් වූ මෝටර් රථ ක්ෂය ගණනය සඳහා යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ඊ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ පිරිවැය රු.මිලියන 97.20ක් විය. විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව අරමුදලින් මේ දක්වා මූල්‍යනය කරන ලද මෝටර් රථ 42 ක් පවතින අතර එහි පිරිවැය එකතුව රු.මිලියන 140.58ක් වේ. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සඳහන් මෝටර් රථ පිරිවැයෙහි සහ අරමුදලින් මූල්‍යනය කරන ලද මෝටර් රථ පිරිවැයෙහි රු.මිලියන 43.38 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) 2023 දෙසැම්බර් 31 දිනට "මෙහෙවර පියස අභ්‍යන්තර නිර්මිත සැකසීමේ නොනිමි වැඩ" ගිණුමෙහි වූ රු.මිලියන 297.89ක ශේෂය කාර්යාල සවිකිරීම් ලෙස ප්‍රාග්ධනිත කර ක්ෂය වීම් ගිණුම්ගත කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ඌ) 2023 දෙසැම්බර් 29 දින කම්කරු මහලේකම් කාර්යාලයේ පළමු මහලෙහි අභ්‍යන්තර නිර්මිත සැකසීම වෙනුවෙන් රු.මිලියන 24.56ක් දරා තිබුණු අතර එම වටිනාකම ප්‍රාග්ධනිත කිරීම වෙනුවට ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 1.3 අරමුදලේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අරමුදලේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස

දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්ථාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදල මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ආ), (ඇ), හා (ඈ) යන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/ විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ | |
| (i) | 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 | 2018 සිට 2023 දක්වා වර්ෂවලට අදාලව ආයතන පරීක්ෂා කටයුතු සිදු කර එකතුව රු.මිලියන 103ක අධිභාර හා දායක මුදල් අය කර ගැනීමේ ප්‍රථම නිවේදනය නිකුත් කිරීම සඳහා දින 22 සිට දින 1438ක් දක්වා වූ කාලයක් ගත වී තිබූ අවස්ථා 70ක් ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය සම්බන්ධයෙන් සිදු කල විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද අවස්ථා 05කට අදාලව අය විය යුතු රු.මිලියන 13.46ක් අය කර ගැනීමට අවසන් නිවේදන නිකුත් කර නොතිබුණි.<br>උතුරු කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට අදාලව 2020 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් දායක මුදල් හා අධිභාර ලෙස පිළිවෙලින් ආයතන 61කට, 16කට හා 8කට අදාලව රු.මිලියන 52.73ක්, රු.මිලියන 95.22ක් හා රු.මිලියන 7.96ක් අයකර ගැනීමට පැවතුණි. |
| (ii) | 2011 අප්‍රේල් මස 29 දිනැති අංක 06/2011 දරන චක්‍රලේඛයේ 2 වන වගන්තිය | කාර්යාලයට පැමිණිල්ලක් ලැබී දින 14ක් ඇතුලත එය විභාග කිරීමට පියවර ගත යුතු වුවත් උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට 2020 සිට 2023 වර්ෂ දක්වා ලද පැමිණිලිවලින් පැමිණිලි 10ක් විභාග කර අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii | 2000 පෙබරවාරි 10 දිනැති අංක 6/2000 දරන චක්‍රලේඛයේ 1(IV) වගන්තිය | 2023 සැප්තැම්බර් 11 දිනට අරමුදලෙහි අධීක්ෂණ දත්ත පද්ධතියට අනුව ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාලව ලියාපදිංචි සක්‍රිය ආයතන 4835ක් හා අක්‍රිය/ වැසූ ආයතන 411ක් විය. ආයතන පරීක්ෂාවන් සිදු කිරීමේදී දිගු කාලයකින් පරීක්ෂාවට භාජනය නොවූ ආයතන පරීක්ෂාව සඳහා තෝරා ගත යුතු බවට චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද උක්ත ආයතන අතරින් සියයට 84ක් 2018 වර්ෂයේ සිට 2023 සැප්තැම්බර් 11 දක්වා කාල පරිච්ඡේදයේදී පරීක්ෂා කර නොතිබුණි. තවද, ගම්පහ කලාපයට අයත් ලියාපදිංචි ආයතන අතරින් ආයතන 8,483ක් සම්බන්ධයෙන්ද අධීක්ෂණයක් සිදු වී නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ 15 වන වගන්තිය | යම් ආයතනයක සේවකයින්ට අදාල දායක මුදල් සෑම මාසයක් අවසාන වී එළඹෙන මාසයේ අවසාන දිනට පෙර අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු වුවත්, උතුරු කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් 2022 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද ආයතන පිළිවෙලින් 89ක් හා 109ක් වෙතින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ලියාපදිංචි දින සිට අදාල දායක මුදල් ගෙවා නොතිබුණද ඒ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.4 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ දූරකථන නාමාවලියේ කහ පිටුවල සහ රේන්බෝ පිටුවල ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් තෝරාගෙන මිල ගණන් කැඳවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 27.89ක් වූ පරිගණක, කැමරා සහ ප්‍රින්ටර් මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගත් ක්‍රමවේදය හෙළිදරව් නොවීය. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් සමාලෝචිත වර්ෂයේදී අර්ථසාධක අරමුදලේ තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 240ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වෙන්කරන ලද ප්‍රතිපාදනයෙන් රු.මිලියන 217.54ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි 2023 ඔක්තෝබර් මාසය වෙනුවෙන් පහසුකම් කළමනාකරණ හා සේවා ගාස්තු සහ අභ්‍යන්තර පිරිසිදු කිරීම් සඳහා සේවා සපයන ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ රු.මිලියන 6.55ක බිල්පතක් ගොඩනැගිල්ලෙහි ස්ථාපිත සියළුම ආයතනවලට විභජනය කිරීමෙන් තොරව සම්පූර්ණ මුදලම අරමුදලෙන් දරා තිබුණි.

(ආ) මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි 2023 ඔක්තෝබර් මාසය වෙනුවෙන් පහසුකම් කළමනාකරණ හා සේවා ගාස්තු සහ අභ්‍යන්තර පිරිසිදු කිරීම් සඳහා සේවා සපයන ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ රු.මිලියන 6.55ක බිල්පතක් ගොඩනැගිල්ලෙහි ස්ථාපිත සියළුම ආයතනවලට විභජනය කිරීමෙන් තොරව සම්පූර්ණ මුදලම අරමුදලෙන් දරා තිබුණි.

(ඇ) අරමුදලෙහි සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේදී එකතුව රු.මිලියන 27.89ක වටිනාකමින් යුත් පරිගණක 60ක්, කැමරා 60ක් සහ මුද්‍රණ යන්ත්‍ර 60ක් මිලදී ගෙන තිබුණි. උක්ත පරිගණක 60න් පළමු පරිගණක 30 මිලදී ගැනීමේ දී යොදාගත් "මතක ධාරිතාව" පිරිවිතරය අවසන් පරිගණක 30 මිලදී ගැනීමේදී වෙනස් කර මිල ගණන් කැඳවා තිබූ අතර දෙවන අවස්ථාවේ දී සඳහන් කර තිබූ පිරිවිතරය උක්ත ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් බව ලිපිගොනු තුලින් තහවුරු විය. ඒ අනුව පළමු අවස්ථාවේ ඒකකයක් රු.335,328 ක් ද දෙවන අවස්ථාවේ ඒකකයක් රු.141,400ක් ද බැගින් මිලදී ගෙන තිබීමෙන් එක් ඒකකයකට දළ වශයෙන් රු. 193,928ක් බැගින් රු.මිලියන 5.82ක් ඉතිරි කර ගැනීමේ හැකියාව අහිමි කර ගෙන තිබුණි. තවද, 2022 ජුනි 01 දින මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා සැලසුම් කර තිබුණද උක්ත උපකරණ අතරින් පරිගණක 51ක් කැමරා 53ක් හා මුද්‍රණ යන්ත්‍ර 50ක් 2024 මාර්තු 14 දින වන විටත් බෙදාහැරීමෙන් තොරව ගබඩාවෙහි පැවතීම හේතුවෙන් දරන ලද වියදමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගෙන නොතිබුණි.

**2.3 වෙනත් කරුණු**

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 95,625ක් වූ සමාජික හිමිකම් පහත සඳහන් හේතු මත එක් එක් සේවායෝජකයින්ගේ කේවල ගිණුම්වලට බැර කර නොතිබුණි.

(i) සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි රඳවාගෙන ඇති රු.මිලියන 12,237ක් වූ මුදල සහ කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 440ක් වූ මුදල,

(ii) සේවායෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙන යනු ලබන "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" නමින් වූ ගිණුමේ පැවති රු.මිලියන 78,797ක ශේෂය, හා

(iii) විවිධ හේතු මත සාමාජිකයින්ට නොගෙවා රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් පවතින රු.මිලියන 1,009ක් වූ ශේෂය ද, ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් පවතින රු.මිලියන 2,590ක් ද, ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් පවතින රු.මිලියන 552ක් වූ ශේෂය.

(iv) සාමාජික ගිණුම්වලට බැර නොකර පවතින ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2013, 2016 හා 2017 වර්ෂවලදී නියෝග කර තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලෙහි අධීක්ෂණ දත්ත පද්ධතියට අනුව උතුරු කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට අදාලව ක්‍රියාකාරි තත්ත්වයේ පවතින සේවායෝජක ආයතන පිළිවෙලින් 226ක් හා 99ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත දායක මුදල් අඛණ්ඩව ගෙවා තිබූ නමුත් අරමුදල සඳහා දායක මුදල් ගෙවා නොතිබුණි. තවද, උතුරු කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට අයත් සේවායෝජක ආයතන පිළිවෙලින් 38ක් හා 35ක් වසා දැමූ ආයතන ලෙස වර්ග කර තිබුණද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත 2023 වර්ෂයේදීද දායක මුදල් ගෙවා තිබුණි. මෙම ආයතන පිළිබඳ පරීක්ෂාවක් සිදු කර අරමුදලට අයවිය යුතු දායක මුදල් සහ අධිභාර අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කම්කරු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට අනුව 2023 නොවැම්බර් 16 දිනට ප්‍රධාන කාර්යාලයේ මරණ ප්‍රතිලාභ අංශයේ අයදුම්පත් 913ක් ගෙවීමට පැවති අතර ඉන් 794ක් දත්ත පද්ධතියට ඇතුලත් කිරීම පමණක් සිදු කල ('Entered Not Reach Modification ') ගොනු ලෙස පැවතුණි. එම අයදුම්පත් වැඩි දුර විශ්ලේෂණය කිරීමේදී අයදුම්පත් 676ක් පමණක් උප කාණ්ඩ වලට බෙදා තිබූ අතර අයදුම්පත් 794න් 118ක් පද්ධතිය තුල නිරීක්ෂණය නොවීය. තවද, මෙම අයදුම්පත් 676න් අයදුම්පත් 222ක් ලැබී වර්ෂ 5ට වැඩි බව අනාවරණය විය.

(ඇ) කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතනයක් විසින් 2019 ඔක්තෝබර් සිට 2022 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදයට අදාල දායක මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් රු.මිලියන 3.27ක් අයකර ගැනීමට පැවතුණි. එම මුදල වාරික 32කින් ගෙවීම සඳහා 2022 දෙසැම්බර් 30 දින අනුමැතිය ලබා දී තිබුණද 2024 ජුනි 30 දින වන විට ඉන් වාරික හතරක් එනම් 510,000 ක් පමණක් අරමුදල වෙත ගෙවා තිබූ අතර තවදුරටත් අයවිය යුතු රු. මිලියන 2.76 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඊ) කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතනයක් විසින් 2011 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා කාලය තුල දායක මුදල් නොගෙවීම මත විභාග වූ නඩුවක තීන්දුව ප්‍රකාරව රු.මිලියන 5.89ක මුදලක් අය කර ගෙන තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 වන විටත් සාමාජිකයින් 7 දෙනෙකුට විභජනය කල යුතු එකතුව රු.මිලියන 1.14ක් විභජනය කර නොතිබුණි.

(උ) සේවායෝජකයන්ට එරෙහිව නඩු පැවරීමෙන් අය කර ගත් මුදල් නිරවුල් කරන තුරු පොදු තැන්පතු ගිණුමක රඳවා තබා ගන්නා අතර 2023 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.මිලියන 440.36ක් විය. ඉන් රු.මිලියන 87.06ක් 2009 වර්ෂයත් 2022 වර්ෂයත් අතර කාලපරිච්ඡේදයේදී අය කර ගන්නා ලද මුදල් වේ. මෙම පොදු තැන්පතු ගිණුමෙහි පවතින මුදල් ලැබිය යුතු සාමාජිකයින් හඳුනාගෙන එම සාමාජිකයින්ගේ කේවල ගිණුම්වලට බැර කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් එම මුදල් ආයෝජනයෙන් ඉපයිය හැකිව පැවති ආයෝජන ආදායම සාමාජිකයින්ට අහිමි වී තිබුණි.

(ඌ) 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් එකතුව රු.මිලියන 12,755.09ක් අයකර ගැනීම සඳහා බාහිර ආයතනවලට එරෙහිව නඩු 14,096ක් පවරා තිබුණි. ඉන් එකතුව රු. මිලියන 2,420 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු 4,381 ක් අක්‍රිය තත්ත්වයේද, එකතුව රු. මිලියන 1,232 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු 2,138 ක් විවෘත වරෙන්තු තත්ත්වයේද පැවතුණි. තවද, බාහිර ආයතන විසින් අරමුදලට එරෙහිව එකතුව රු. මිලියන 201.3 ක් ඉල්ලුම්කර නඩු 62 ක් අධිකරණයෙහි පවරා තිබුණි.

(එ) 2024 මැයි 08 දින කම්කරු දෙපාර්තමේන්තුවේ පරිගණක දත්ත පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අරමුදල වෙත ඉදිරිපත් කල අයදුම්පත් අතරින් එදින වන විට ප්‍රතිලාභ නිදහස් කර නොතිබූ මුලු අයදුම්පත් සංඛ්‍යාව 5,559ක් විය. එම අයදුම්පත් අතරින් අයදුම්පත් 1344 ක් 2012 සිට 2023 දක්වා වර්ෂවලදී භාර ගන්නා ලද අයදුම්පත් වන අතර අදාල අයදුම්පත් 1344 අතරින් අයදුම්පත් 463ක් දත්ත පද්ධතියට ඇතුලත් කිරීම පමණක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමෙන් තොරව පැවති අතර අයදුම්පත් 81 හා 172 ක් පිළිවෙලින් ප්‍රතිලාභ ගෙවීම සඳහා බලය දීම (Claims for Authorization) සහ අනුමත කිරිම (Claims for Approval) යන අදියරයන්වලින් සමන්විතව ප්‍රතිලාභ නිදහස් කිරීමේ ක්‍රියාවලිය සඳහා දිගු කාලයක් ගත කිරිම හේතුවෙන් සාමාජිකයන්ට අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම තුලින් ඔවුන් හට අවාසිදායක තත්ත්වයක් උද්ගතවන බව නිරික්ෂණය විය.

(ඒ) සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි නොවී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි පමණක් ලියාපදිංචි වී තිබූ සේවායෝජකයින් සංඛ්‍යාව 2023 දෙසැම්බර් 31 දිනට 28,994ක් වූ අතර එම සේවායෝජකයන්ගෙන් එදිනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ලැබී තිබූ දායක මුදල්වල එකතුව රු.මිලියන 401.25ක් විය. ඒ අනුව එම සේවායෝජකයින් අතරින් අරමුදලෙහි ලියාපදිංචි විය යුතු එහෙත් ලියාපදිංචි වීම පැහැර හැර ඇති සේවායෝජකයින් හඳුනාගෙන අරමුදෙලහි ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය වී සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ඔ) 2023 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 15ක සිදුකර තිබූ රු. මිලියන 17,401.39ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද, ලැයිස්තුගත සමාගම් 09 ක සිදුකර තිබූ රු. මිලියන 4,390.49ක් වූ සමාන්‍ය කොටස් ආයෝජනයන් වෙනුවෙන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ද අරමුදලට ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

(ඕ) ආයෝජන සඳහා ගෙවීම් නිෂ්කාශනය කිරීමේ පාලන ගිණුමෙහි (Investment Clearing Account) 2016 වර්ෂයේ සිට පැවත එන රු. මිලියන 8.2ක්ද, වත්කම් අපහරණය කිරීමේ ගිණුමෙහි පැවති 2023 වර්ෂයේදී වත්කම් අපහරණයෙන් ලද රු.මිලියන 2.79 ක්ද ලෙස එකතුව රු.මිලියන 10.99 ක් නිරවුල් කිරීමෙන් තොරව "වෙනත් ගෙවිය යුතු වියදම්" ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(ක) අරමුදලෙහි බැංකු ගිණුම්වලට අදාළව සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනවල 2001 වර්ෂයේ සිට පැවත එන නොසැසඳුනු බැංකු ගිණුම් ශේෂ නිරවුල් කිරීම සඳහා 2020 ජනවාරි 09 වන දින පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම්ගත දින සිට සති 08ක් තුල අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතුව පැවතියත්, අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු මෙම වාර්තාවේ දින වන විටත් අත්කර ගෙන නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ගිවිසුම්ගත මුදලින් සියයට 50ක් එනම් රු. මිලියන 1.56ක් ගෙවා තිබුණි.

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**

**විගණකාධිපති**